**වයඹ පලාත් පාලන දෙපාර්තමේන්තුව**

**වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව**

**2022 වර්ෂයේ /51 වන සභා වාරයේ මහා සභා රැස්වීම් වාර්තාව -කෙටුම්පතකි**

**2022-05-19**

**පැමිණීම**

1. ගරු සභාපති කේ.වී.සුසන්ත පෙරේරා මහතා
2. ගරු උපසභාපති ආර්.ඒ.නිලංක සඳකැල් මහතා
3. ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා
4. ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා
5. ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා
6. ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතා
7. ගරු මන්ත්‍රිනී ආර්.නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය
8. ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා
9. ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා
10. ගරු මන්ත්‍රී ඩබ්.ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතා
11. ගරු මන්ත්‍රී ඒ.රෙක්ෂි ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
12. ගරු මන්ත්‍රී කේ.එල්.චමින්ද කුමාර කරුණානායක මහතා
13. ගරු මන්ත්‍රිනී ජී.ලීනා ප්‍රියංගිකා පෙරේරා මහත්මිය
14. ගරු මන්ත්‍රී කේ.නොඑල් සුදත් ජානක පෙරේරා මහතා
15. ගරු මන්ත්‍රිනී අයි.එච්.නයෝමි රම්‍යලතා මහත්මිය
16. ගරු මන්ත්‍රී එල්.දිනේෂ් චන්දන පෙරේරා මහතා
17. ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා
18. ගරු මන්ත්‍රී ඩබ්. ශිරෝන් ගාමිණී අසෝක ප්‍රනාන්දු මහතා
19. ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා
20. ගරු මන්ත්‍රී ඩී.නිමල් අරුණ ශාන්ති විජේතුංග මහතා
21. ගරු මන්ත්‍රී බී.ඒ.එස්.ශාන්ත පෙරේරා මහතා
22. ගරු මන්ත්‍රී ඩබ්.සුරේන් ඇන්ටන් ශ්‍රීනාත් ප්‍රනාන්දු මහතා
23. ගරු මන්ත්‍රිනී එච්.එම්.එස්.බී. කරුණාරත්න මෙනවිය
24. ගරු මන්ත්‍රිනී පී.එම්.ලිහිණි අනුත්තරා ප්‍රභාෂි මෙනවිය
25. ගරු මන්ත්‍රිනී එම්.එම්.මේරි.වාලට් කුරේ මහත්මිය
26. ගරු මන්ත්‍රී වී.ඒ.වර්ණ රංග ගුණසේකර මහතා
27. ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ගෝඨාභය වික්‍රමසිංහ මහතා

28. ගරු මන්ත්‍රිනී ඒ.එම්.චමිලා දිල්රුක්ෂිකා මහත්මිය
29. ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා
30. ගරු මන්ත්‍රී එස්.එම්.සුදත් චන්දන මහතා
31. ගරු මන්ත්‍රී වී.කේ.එම්.අසන්ත කුලසේකර මහතා
32. ගරු මන්ත්‍රී අයි.බී.සෑම් හරිෂ්නාත් සරත්චන්ද්‍ර මහතා
33. ගරු මන්ත්‍රී එස්.එම්.දර්ශන දිමුතු කුමාර සුහසිංහ මහතා

මෙදින පෙ.ව.10.00ට මහා සභා රැස්වීමේ කටයුතු ගරු සභාපති කේ.වී.සුසන්ත පෙරේරා මහතාගේ ප්‍රධානත්වයෙන් වෙන්නප්පුව ප්‍රාදේශීය සභා මහා සභා රැස්වීම් ශාලාවේදී ආරම්භ විය.

ආගම සිහිකිරීමෙන් අනතුරුව මහා සභා රැස්වීම සඳහා සහභාගී වී සිටින ගරු උපසභාපතිතුමා ඇතුළු සියළුම ගරු මන්ත්‍රීතුමන්/තුමියන් හා සහභාගී වී සිටින ලේකම්මහතා හා එම නිලධාරීන් ඇතුළු සියළු දෙනාම මහා සභා රැස්වීම සඳහා ගරු සභාපතිතුමා විසින් පිළිගන්නා ලදී.

## 01. 2022-04-08 වන දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව සම්මත කිරීම.

ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව 22 වන පිටුවේ තම කතාවේදී " විසි වන සංශෝධනය අනුව 69 ලක්ෂයක බලයක්" ලෙස සඳහන් වී ඇති බවත්, එය "ජනාධිපතිවරණයේදී 69 ලක්ෂයක බලයක්" ලෙස සංශෝධනය විය යුතු බව ප්‍රකාශ කරන ලදී.

එමෙන්ම 23 වන පිටුවේ තමන් කතාවේදී ගරු සනත් නිශාන්ත ඇමතිතුමාගේ සහෝදරයාව අත්අඩංගුවට ගෙන නොමැති බවත්, එයට හේතුව සඳහන් කල බවත්,නමුත් එම කොටස වාර්තාවේ සඳහන් වී නොමැති බවත්, එය වාර්තාවට ඇතුළත් විය යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

හඬ පටිය පරීක්ෂා කර බලා අවශ්‍ය සංශෝධනයන් සිදු කරන බවට ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

ඒ අනුව ගරු මන්ත්රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතාගේ කතාවේ පලමු ඡේදයේ එම කොටස පහත පරිදි සංශෝධනය විය.

"ගරු සභාපතිතුමාලාට අධික බලයක් සහිත ආණ්ඩුවක් තිබෙන බවත්, ජනාධිපතිවරයෙකු සිටින බවත්,තුනෙන් දෙක තිබෙන බවත්,විධායක බලතල තිබෙන බවත්,අධික බලයක් ජනතාව ලබා දී තිබෙන බවත්,ජනතාව පොඩි ප්‍රමාණයක් නොව 69 ලක්ෂයක බලයක් ලබා දී ඇති බවත් ප්‍රකාශ කරන ලදී."

ඒ අනුව ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතාගේ කතාවේ දෙවන ඡේදයේ එම කොටස පහත පරිදි සංශෝධනය විය.

" ගරු සනත් නිශාන්ත ඇමතිතුමාගේ සහෝදරයා වන ජගත් සමන්ත නම් පුද්ගලයා තම පක්ෂයේ කෙනෙකුට පහර දුන් බවත් අදටත් අත්අඩංගුවට ගෙන නොමැති බවත් එක රටක් එක නීතියක් නම් එයද ක්‍රියාත්මක විය යුතු බවත් ප්‍රකාශ කරන ලදී."

තීරණ අංක 01

2022-04-08 වන දින පැවති මහා සභා වාර්තාව සංශෝධන වලට යටත්ව සත්‍ය වාර්තාවක් බවට ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ හා ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය.

## 02. ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන

### 01.නිවාඩු අනුමත කිරීම

a) මහා සභාව සඳහා නොපැමිණෙන ගරු මන්ත්‍රීවරුන්ගේ හා ගරු මන්ත්‍රීවරියන්ගේ නිවාඩු අනුමත කිරීම.

තීරණ අංක 02

මහා සභා රැස්වීමට සහභාගී වීමට නොහැකි බව දන්වා නිවාඩු අයදුම්කර ඇති පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන්ගේ හා ගරු මන්ත්‍රීවරියන්ගේ නිවාඩු අනුමත කිරීම සඳහා ගරු සභාපතිතුමා ඉදිරිපත් කල යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දීමට තීරණය කරන ලදී.

- ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා
- ගරු මන්ත්‍රිනී ජේ.කේ.දීපා මේරි අයිරංගනී පෙරේරා මහත්මිය
- ගරු මන්ත්‍රී ඩබ්.ඒ.රෙන්ෆ්‍රිඩ් ෂවීන් ප්‍රනාන්දු මහතා
- ගරු මන්ත්‍රී ආර්.පී.අකිල ශිරංග රාජපක්ෂ මහතා
- ගරු මන්ත්‍රී ඩබ්.ස්ටැන්ලි තිසේරා මහතා
- ගරු මන්ත්‍රී ජී.අශේන් විමුක්ති ප්‍රනාන්දු මහතා
- ගරු මන්ත්‍රී එච්.ඒ.ක්ලීටස් පෝල් පෙරේරා මහතා
- ගරු මන්ත්‍රී එල්. සුසන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු මහතා

- ගරු මන්ත්‍රිනී ඩබ්.දුලක්ෂි වමෝදරී ප්‍රනාන්දු මහත්මිය

b) කාරක සභා සඳහා නොපැමිණි ගරු මන්ත්‍රීවරුන්ගේ හා ගරු මන්ත්‍රීවරියන්ගේ නිවාඩු අනුමත කිරීම.

තීරණ අංක 03

2022 අප්‍රියෙල් මස පැවති පහත සඳහන් කාරක සභා සඳහා **සහභාගී නොවූ පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන්ගේ හා ගරු මන්ත්‍රීවරියන්ගේ නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.**

**2022 අප්‍රියෙල් මස 29** වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව

| අ/අ | නම |
|---|---|
| **1.** | ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා |
| **2.** | ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා |
| **3.** | ගරු මන්ත්රී කේ. නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්රනාන්දු මහතා |
| **4.** | ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා |
| **5.** | ගරු මන්ත්රිනී නිරෝෂා ජීවන්ති ප්රනාන්දු මහත්මිය |
| **6.** | ගරු මන්ත්‍රී ඩබ්.ශිරෝන් ගාමිණි අසෝක ප්‍රනාන්දු මහතා |
| **7.** | ගරු මන්ත්‍රිනි එච්.එම්. සුදර්ශි භාග්‍යා කරුණාරත්න මෙනවිය |

**2022 අප්‍රියල් මස මස 01** වන දින පැවති මාර්ග, ඉඩම් , ගොඩනැඟිලි හා කාර්මික සේවා කාරක සභාව

| අ/අ | නම |
|---|---|
| **1.** | ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා |
| **2.** | ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා |
| **3.** | ගරු මන්ත්රිනී නිරෝෂා ජීවන්ති ප්රනාන්දු මහත්මිය |
| **4.** | ගරු මන්ත්‍රී ඒ.රෙක්ෂි ප්‍රභාත් ප්‍රනාන්දු මහතා |
| **5.** | ගරු මන්ත්‍රී ජී.කේ.අශේන් විමුක්ති ප්‍රනාන්දු මහතා |
| **6.** | ගරු මන්ත්‍රී එල්.දිනේෂ් චන්දන පෙරේරා මහතා |
| **7.** | ගරු මන්ත්‍රී ඩබ්.ශිරෝන් ගාමිණි අසෝක ප්‍රනාන්දු මහතා |
| **8.** | ගරු මන්ත්රී එල්.සුසන්ත ශ්‍රිනාත් ප්‍රනාන්දු මහතා |

C) ගරු මන්ත්රිනී ආර්.පී.නදීකා රණවීර මහත්මිය විසින් වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීම සඳහා විදෙස්ගත වී ඇති බවත් ඒ සඳහා කාලය ප්‍රමාණවත් නොවූයෙන් තවදුරටත් 2022 මැයි මස සිට මාස 03ක කාලයක් සඳහා නිවාඩු ලබා දෙන ලෙස එම මන්ත්‍රීවරිය විසින් ඉදිරිපත් කර ඇති ඉල්ලීම සලකා බලන ලද අතර පහත සඳහන් පරිදි තීරණය කරන ලදී.

තීරණ අංක 04

ගරු මන්ත්රිනී ආර්.පී.නදීකා රණවීර මහත්මිය විසින් වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීම සඳහා විදෙස්ගත වී ඇති බවත් ඒ සඳහා කාලය ප්‍රමාණවත් නොවූයෙන් තවදුරටත් 2022 මැයි මස සිට මාස 03ක කාලයක් සඳහා නිවාඩු ලබා දීම **සුදුසු බවට ගරු සභාපතිතුමා විසින්** ගෙන එන ලද **යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.**

02. ලෝක මිහිතල දිනයට සමගාමීව වයඹ භූමි හරිත භූමි ව්‍යාපෘතිය යටතේ වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවෙන් ලබා දුන් පැල සිටුවීම පසුගිය දින පුස්තකාල පරිශ්‍රය තුල සිදු වූ බවත්, සඳහා සහයෝගය ලබා දුන් ප්‍රජා සංවර්ධන කමිටු සභාපතිතුමා ඇතුළු කමිටු සාමාජිකයින් සියළුම දෙනාටද, ලේකම්මහතා ඇතුළු විෂය භාර නිලධාරීන්ටද ස්තූතිය පුද කරන ලදී.

03. අඩු ආදායම්ලාභී පුද්ගලයින් වෙත වෛද්‍යාධාර බෙදා දීමක් පසුගිය දිනවල සිදු වූ අතර ඒ සඳහා සහයෝගය ලබා දුන් සියළුම දෙනාට ස්තූතිය පුද කරන ලදී.

04. පසුගිය මැයි මස 09 වන දින ඇති වූ ඛේදවාචකයත් සමඟ අප සභාවේ ගරු මන්ත්‍රීවරුන්/වරියන් කීපදෙනෙකු සහ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ආසන සංවිධායක ගරු ට්‍රෙවින් ප්‍රනාන්දු මැතිතුමා, ගරු රාජ්‍ය අමාත්‍ය අරුන්දික ප්‍රනාන්දු මැතිතුමා ,ගරු මන්ත්‍රී එල්.දිනේෂ් චන්දන පෙරේරා මහතා ඇතුළු කීපදෙනෙකුගේ නිවෙස් ගිණිතබා විනාශ කල බවත්, එමෙන්ම තම නිවස, ගරු මන්ත්‍රී යූ.ජුඩ් එම්මානුවෙල් මහතාගේ නිවස, ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ නිවස,ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතාගේ නිවස සහ ගරු මන්ත්‍රීනී ජේ.කේ.දීපා මේරි අයිරංගනී පෙරේරා මහත්මියගේ නිවස යන නිවෙස් වලට ගල් ප්‍රහාර එල්ල කර විනාශ කල බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. අරගලයේ සාධාරණත්වය මෙන්ම මෙම සිදුවීම් ම්ලේච්ඡ ප්‍රහාරයන් බවත්, ඒ පිළිබඳ වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ සහ වෙන්නප්පුව බල ප්‍රදේශයේ ජනතාවගේ බලවත් කණගාටුව දැනුම් දෙන ලදී. ජනතාව එමෙන්ම කතෝලික පියතුමන්ලා සහ ගරුතර සංඝරත්නය මෙය හෙළා දකින ලෙසට කතා කර තමන්ට පැවසූ බවත්, එම නිසා ඇති වූ සම්පූර්ණ ඛේදවාචකය මෙම මහා සභාවේදී හෙළා දකින බවත් දැනුම් දෙන ලදී.

සොයා ගෙන ඇති තොරතුරු සහ අත්අඩංගුවට ගෙන ඇති පිරිස අනුව මෙය සම්පූර්ණයෙන්ම සංවිධානය කර සිදු කල කටයුත්තක් බවත්,එම ගත් වැයමට තම සියළු දෙනාගේම නිවෙස් සාක්ෂි දරණ බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. වසර ගණනාවක් දේශපාලනය කල පිරිසක් මෙම සභාවේ සිටින බවත්, වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව කෙදිනකවත් පක්ෂ පාට භේද බලා කටයුතු නොකල බවත්,එමෙන්ම ගරු රාජ්‍ය අමාත්‍ය අරුන්දික ප්‍රනාන්දු මැතිතුමාද එලෙසම පක්ෂ පාට නොබැලූ නායකයෙකු බවත්, ප්‍රකාශ කරන ලදී. එලෙසම හිටපු ගරු සභාපති ට්‍රෙවින් ප්‍රනාන්දු මහතාද කාලයක් වෙන්නප්පුව බල ප්‍රදේශයේ ප්‍රධාන පුරවැසියා වී සිට විශාල සේවයක් ඉටු කල බවත්,එතුමා පලාත් සභා මන්ත්‍රීවරයෙකු ලෙසද කටයුතු කල බවත්,එතුමාගේ නිවස වසර එකසිය ගණනක් පැරණි බවත්,එම නිවසට නොපැමිණි පක්ෂයේ නායකයෙකු නොමැති බවත් සියළු දෙනාම පය ගැසූ බිමක් බවත්, එයද සම්පූර්ණයෙන් විනාශ වී ඇති බවත් ප්‍රකාශ කරන ලදී. මෙම සියල්ල සඳහා වෙන්නප්පුව බල ප්‍රදේශයේ ජනතාවගේ බලවත් ශෝකය සහ කණගාටුව ප්‍රකාශ කරන ලදී.ඒවා සිදු නොවිය යුතු දේවල් බවත්, මෙය අනිවාර්යෙන්ම සංවිධානය කර සිදු කල දේවල් බව නොබියව තමන් පවසන බවත් ප්‍රකාශ කරන ලදී.එදින කොළඹ රැස්වීමට සහභාගී වීමට ගිය බවත්, නමුත් අරගල භූමියට නොගිය බවත්, තමන් දහවල් එක,දෙක පමණ වන විට කාර්යාලයටද පැමිණි බවත් ප්‍රකාශ කරන ලදී. අප සභාවේ ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමා පළමු පණිවිඩය ලබා දී ඇති බවත්, තමන් 27 දෙනෙකු සමඟ බස් රථයක කොළඹ ගිය බවට එහි සඳහන් කර තිබූ බවත්, එම බොරු ප්‍රචාරයත් සමඟ සියළුම දෙනා viber ඔස්සේ සාකච්ඡා කොට ඇති බවත්,එම සියළුම තොරතුරු මේ වන විට සොයාගෙන ඇති බවත් ප්‍රකාශ කරන ලදී. එලෙස කිසිවක් සොයා නොබලා පණිවිඩ හුවමාරු කිරීම සම්පූර්ණයෙන්ම අසාධාරණ බවත්,ඒවා කෙදිනක හෝ තම තමන්ට ගෙවීමට සිදු වන බවත් ප්‍රකාශ කරන ලදී.ඊයේ දින පාර්ලිමේන්තුවේදී ගරු රාජ්‍ය අමාත්‍ය අරුන්දික ප්‍රනාන්දු මහතා පැහැදිලි කතාවක් සිදු කල බවත්,ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අනුර කුමාර දිසානායක මහතා එතුමාගේ පක්ෂයේ කිසිවෙකු සම්බන්ධ වී සිටී නම් එය පවසන ලෙසට පැවසූ බවත්, ඊට පෙර තමන් සමඟ ඇමතිතුමා සම්බන්ධ වී තිබුණේනම් තමන් මෙතුමාගේ නම ලබාදෙන බවත් ප්‍රකාශ කරන ලදී. අපේම මන්ත්‍රීවරයෙකු එලෙස පළමු බොරු පණිවිඩයක් ලබා දීම ඉතාමත් කණගාටුදායක බවත් ප්‍රහාරය එල්ල කිරීමට ලඟම සිදු වීම එය බවත් එම තොරතුරු අනුව තමාව සෙවූ බවත්, නිරපරාදේ තමන් ඔවුන්ට මැදි වූයේ නම් වාහනය පවා කුඩු වීමට ඉඩ තිබූ බවත්,දේශපාලනය කරන උදවිය වශයෙන් මීට වඩා කල්පනා කිරීමට තිබූ බවත් ප්‍රකාශ කරන ලදී.

අරගලය කිසි දා හොඳ නොමැතියැයි නොපැවසූ බවත්,ගෝඨාගෝගම වෙන්නප්පුව නගරයේ ස්ථාපිත කිරීමේදී මන්ත්‍රීවරුන් කීපදෙනෙකුම උසාවි නියෝගයක් ගෙන එය ඉවත් කිරීමට පැවසුවද ගලවා

දැමීමට කටයුතු නොකල බවත් ප්‍රකාශ කරන ලදී. මෙම කටයුත්ත තමන් තරයේ හෙළා දකිනා බවත් තවදුරටත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. අද වන විට අරගලය තුළින් කුඩා දේ දිනාගත්තද ඊටත් වඩා විශාල හානියක් අප මාතෘ භූමියට සිදු වී ඇති බවත් ඉතිහාසගත විනාශයක් සිදු වී ඇති බවත් ප්‍රකාශ කරන ලදී. සිදු වූ පාඩුව මිලියන ගණනාවක් බවත්,මාර්ග නාමපුවරුද කඩා බිඳ දමා ඇති බවත්, ඒවා අනුමත කල නොහැකි බවත් system change එකක් සිදු විය යුතු බවත් නමුත් පිටරටවල සිටින ම්ලේච්ඡ ගෝත්‍රික ජනතාවට වඩා එහා ගිය ජාතියක් ලෙස ශ්‍රී ලාංකික අප නම් කල හැකි බවත්,තවමත් මනුස්සකම් සමඟ වෙනස් වී හික්මීමක් ඇති කර ගත් ජනතාව නොමැති බවත් ප්‍රකාශ කරන ලදී. අද වන විට වයස අවුරුදු 16,17 පමණ දරුවන් දෙස බැලීමේදී ඉදිරි අනාගතය පිලිබඳව සිතාගැනීමටවත් නොහැකි බවත්,වැඩිහිටියන් ලෙස අප ඒවා පිළිබඳවද කල්පනා කල යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

තමන් ගරු පියතුමන්ලාටද තම නිවසට පැමිණි පිරිසටද පැවසුයේ අරගල සිදු කර ඇති කල එකම දෙය නම් නිරපරාදේ මෙම විනාශය සිදු කිරීම බවත්, ඒවාට ඉදිරිපත් වී බේරුම් කලේ නම් අද එය වටිනා බවත් යැයිද ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.විශේෂයෙන් වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව පොදුවේ සියළු වැඩ කටයුතු වලට සහයෝගය ලබා දුන් බවත්,එලෙස කටයුතු සිදු කලද නිවෙස් විනාශ කර දැමූ බවත් ප්‍රකාශ කරන ලදී.

තමන් මෙම සේවයට පැමිණියේ 2011 වසරේ බවත්, නිවෙස 2007,2008 වර්ෂවලදී සෑදූ බවත් එබැවින් එම නිවසේ කිසිඳු සභාවේ යැයි පැවසිය හැකි මුදලක් යොදවා නොමැති බවත් දෙමාපියන්ගෙන් ලැබුණු දේවල් බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. දරුවන් තවමත් බියෙන් පසුවන බවත්,තම හිතවතුන් සියළුම දෙනා දේශපාලනයෙන් ඉවත් වන ලෙසට පවසන බවත්, නිදහසේ ව්‍යාපාර කරගෙන ගිය තම සහෝදරයන්ටද ගැටළු මතු වූ බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී. ඉදිරියේදී දේශපාලනය කිරීමට පිරිසක් ඉතිරි නොවන බවත්, මූණට කෙතරම් බැන ගත්තද වෙනත් පළි ගැනීම් කෙදිනකවත් සිදු කර නොමැති බවත්,මින් පසුවවත් වෙන්නප්පුව බල ප්‍රදේශයේ මෙවැනි සිදු වීම් සිදු නොවීමට වග බලා ගනිමුයැයිද ප්‍රකාශ කරන ලදී. අපහසුතාවයට පත් වූ සියළුම මන්ත්‍රීවරුන්ට තමාගේ හා වෙන්නප්පුව බල ප්‍රදේශයේ ජනතාවගේ බලවත් කණගාටුව ප්‍රකාශ කරමින් ගරු සභාපතිතුමා තම කතාව අවසන් කරන ලදී.

❖ මෙම අවස්ථාවේදී ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇනිටනී කුමාර් මහතා අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ඉල්ලා සිටියද එයට වෙනත් කරුණු යටතේ අවස්ථාවක් ලබා දෙන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදී.
  එසේ නම් ගරු සභාපතිතුමාටද මෙය වෙනත් කරුණු යටතේම පැවසීමට තිබූ බවත්,චෝදනාවක් සිදු කර එයට පිළිතුරු ලබා දීමට අවස්ථාව එම අවස්ථාවේදීම ලබානොදෙන බවත් එය සාදාචාරසම්පන්න නොවන බවත් ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇනිටනී කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී.

## 03.යථා පරිදි කල් දී ඇති යෝජනා

### a. ගරු සභාපතිතුමාගේ යෝජනා

i. වෙන්නප්පුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව සතු මාර්ග 4013ක් ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කිරීමට අදාලව මහා සභා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

වයඹ පළාතේ වැඩිම මාර්ග සංඛ්‍යාවක් අප සභාව සතුව තිබෙන බවත්, මෙම සියළුම මාර්ග ගැසට් කිරීමෙන් නීත්‍යානුකුල අයිතියක් ලැබෙන බැවින් ඉදිරියේදී ගැටළුවක් මතු නොවන බවත්,තමන් විසින් මෙය ආණ්ඩුකාරයාට පිළිගැන්වීමට සූදානමින් සිටින බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

පොදු ජල බස්නා ඇළ මාර්ග ඇතුළත් කරන ලෙසත් ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.ඒ සම්බන්ධව මහා සභාවට මින් පෙර පැමිණි බවත්,තමන් සිටිනුයේ එම ජල මාර්ග මුහුදට ගලා බසිනා ප්‍රදේශයේ බවත්, එබැවින් ඒ සියල්ලම මෙලෙස සිතියම් ගත කර ප්‍රමාණය සඳහන් කරන ලෙසත් මේවා අනාගතයට වැදගත් බවත් ප්‍රකාශ කරන ලදී.

එය කර්මාන්ත කමිටුවේද යෝජනා කල බව ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ගෝධාභය වික්‍රමසිංහ මහතා ප්‍රකාශ කරන ලදී.

එයද ඉදිරියේදී දෙවන වැඩ පිළිවෙල ලෙස සිදු කරමුයැයි ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

✪ ගරු සභාපතිතුමාගේ හා ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහා සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත් කර ලේකම්මහතාට තොරතුරු ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දෙන ලදී.

ලේකම් මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළු දෙනාගෙන්ම අවසර ගැනීමෙන් පසුව වයඹ පළාතම ඒකාබද්ධ කර සෑම ප්‍රාදේශීය සභාවකම මෙය සිදු කරගෙන යන බවත්,ඒ අතරම මේ වන විට වයඹ පලාතේ වැඩිම මාර්ග සංඛ්‍යාවක් වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවට තිබෙන බවත් ප්‍රකාශ කරන ලදී. හැකි කඩිනමින් අළුතින් බඳවාගත් කණ්ඩායම යොදවා මෙම සියල්ල සිදු කල බවත්, මෙම මෘදුකාංගයට ගිය පසුව මාර්ගයේ සියළුම තොරතුරු ලබා ගත හැකි බවත් ප්‍රකාශ කරන ලදී.ඉඩමක් කඩා නව මාර්ග ඇති වුවහොත් මාර්ග ප්‍රමාණය වැඩි වන බවත් පෞද්ගලික මාර්ග 80කද තොරතුරු මෙයට ඇතුළත් කර ඇති බවත්, මෙය GIS තාක්ෂණය ඔස්සේ ඔවුන්ගේම දූරකථනය යොදා ගනිමින් සිදු කල බවත් ඉතාමත් අසීරුවෙන් මෙම වැඩ කටයුත්ත සිදු කල බවත් ප්‍රකාශ කරන ලදී. මින් වසර 30කට පමණ ඉදිරියට වෙන්නප්පුවේ මාර්ග පිළිබඳව කිසිවෙකුට ගැටළුවක් මතු නොවන බවත් ප්‍රකාශ කරන ලදී.

මෙහි ඊළඟ බලාපොරොත්තුව කොට්ඨාස 25 වෙන් කිරීම බවත් එයද සිදු කරන බවත් තවදුරටත් ලේකම්මහතා ප්‍රකාශ කරන ලදී. එමෙන්ම ඇළ මාර්ග සම්බන්ධයෙන්ද ගරු මන්ත්‍රීතුමන්ලා ඉල්ලීමක් කල බවත්, ඇළ මාර්ග සභාව සතුව නොවන බවත් ඒවායෙහි තොරතුරු අදාල ආයතන සමඟ සම්බන්ධ වී ලබා ගත යුතු බවත් ප්‍රකාශ කරන ලදී. කෙසේ නමුත් එය ඉතාමත් හොඳ යෝජනාවක් බැවින් කොමසාරිස්තුමා සමඟ සාකච්ඡා කොට එයද ඉදිරියේදී සිදු කිරීමටකටයුතු කරන බවත් ප්‍රකාශ කරන ලදී.

ප්‍රධාන මාර්ග වල සංවර්ධනයත් සමඟ වසා ඇති බොක්කු විවෘත කරන බවත් ඇතුළට වීමට තිබෙන මාර්ග බෝක්කු නිරාකරණය කර ගත යුතු බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

තීරණ අංක 05

2021-07-30 වැනි දින අංක 2238/35 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කර ඇති " වයඹ පළාත් ප්‍රාදේශීය සභා විසින් පවත්වාගෙන යනු ලබන පාරවල් හා පටු මාවත් වල සැලසුම් පිළියෙල කිරීම හා නාම ලේඛනය දක්වමින් දැන්වීම් පළ කිරීම" පිළිබඳ නියෝග මාලාවේ 4(i) නියෝගයේ සඳහන් පරිදි වෙන්නප්පුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව සතු වී ඇති සේ සලකනු ලැබූ හඳුනාගත් මාර්ග 4013ක අයිතිය වයඹ පලාත් පාලන කොමසාරිස්තුමාගේ අනුමැතිය මත ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා විසින් **ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.**

තීරණ අංක 06

අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කර වෙන්නප්පුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව සතු ඇළ මාර්ග ද ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කිරීම සුදුසු බවට ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා යෝජනා කල අතර එම යෝජනාව **ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය**

**ලබා දෙන ලදී.**

ii. සේවා ගිවිසුම් පදනම මත සේවයේ යෙදී සිටින සේවක මහත්ම මහත්මීන් 07 දෙනෙකුගේ සේවා කාලය දීර්ඝ කිරීමට අදාලව මහා සභා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

තීරණ අංක 07

සේවා ගිවිසුම් පදනම මත සේවයේ යෙදී සිටින පහත නම් සඳහන් සේවක මහත්ම මහත්මීන් 07 දෙනෙකුගේ සේවා කාලය මාස 06කින් දීර්ඝ කිරීම සුදුසු බවට **ගරු සභාපතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.**

| **අ.අ** | **නම** | **සේවා දිගුව අවශ්‍ය තනතුර** | **සේවා ගිවිසුම/සේවා දිගුව ලබා සිටින කාලසීමාව** | **සේවා දිගුව අපේක්ෂිත කාල සීමාව** |
|---|---|---|---|---|
| 01 | ඒ.පී.ඩී. ප්‍රියංකර පෙරේරා මයා (ප්‍රධාන කාර්යාලය) | සෞඛ්‍ය කම්කරු | 2021.11.03 සිට 2022.05.02 දක්වා | 2022.05.03 සිට 2022.11.02 දක්වා |
| 02 | එම්.පී.අමිල කුමාර මයා (ඕ/උතුර සෞඛ්‍ය අංශය) | සෞඛ්‍ය කම්කරු | 2021.11.03 සිට 2022.05.02 දක්වා | 2022.05.03 සිට 2022.11.02 දක්වා |
| 03 | ඩබ්.ඒ. රොෂාන් ප්‍රියදර්ශන වීරසිංහ මයා (ඕ/උතුර) | මුරකරු | 2021.11.29 සිට 2022.05.28 දක්වා | 2022.05.28 සිට 2022.11.27 දක්වා |
| 04 | ඊ. නිරෝෂනි කාංචනා මෙය (කිරිමැටියාන මහජන පුස්තකාලය) | පුස්තකාල සහයක | 2021.11.27 සිට 2022.05.26 දක්වා | 2022.05.26 සිට 2022.11.25 දක්වා |
| 05 | ජී. හිරුණි රංජලා ප්‍රනාන්දු මෙය (ප්‍රජා සංවර්ධන අංශය) | පුස්තකාල සහයක | 2021.11.27 සිට 2022.05.26 දක්වා | 2022.05.26 සිට 2022.11.25 දක්වා |
| 06 | එම්. ශාමල් අකලංක ප්‍රනාන්දු මයා (දංකොටුව මහජන පුස්තකාලය) | පුස්තකාල සහයක | 2021.11.27 සිට 2022.05.26 දක්වා | 2022.05.26 සිට 2022.11.25 දක්වා |
| 07 | ආර්.ඉෂානි ශෂිකලා ප්‍රනාන්දු මෙය (වෙන්නප්පුව මහජන පුස්තකාලය) | පුස්තකාල සහයක | 2021.11.27 සිට 2022.05.26 දක්වා | 2022.05.26 සිට 2022.11.25 දක්වා |

iii. ආදහනාගාර සඳහා මිල දී ගනු ලබන 37.5kg ක ගෑස් සිලින්ඩර් වල මිල සතියක් පාසා වැඩි වන බැවින්ද,මෙම ගෑස් සිලින්ඩර මිලදී ගැනීම ගැටළුවක් වී ඇති බැවින්ද ඒ පිළිබඳව ගරු සභාපතිතුමා ගරු සභාවට ඉදිරිපත් කර සාකච්ඡා කරන ලදී.

මෙහිදී ආදහනාගාරයේ මිල ගණන වෙනස් නොවන්නේ දැයි ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා විමසා සිටින ලදී.

මුදල් කමිටුවේදී එම මිල වැඩි කල බව ගරු සභාතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙම ගෑස් වල මිල ගණන් ඉදිරියේදී වෙනස් වන බවත් එය පාලනය කල නොහැකි බවත් නමුත් එය අනිවාර්යයෙන්ම ලබා ගත යුතු බැවින් මෙහිදී වෙනස් වන මිල ගණනට මිලදී ගැනීමට තීරණය කරමුයැයි ගරු මන්ත්‍රී සී.පී. සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.

තීරණ අංක 08

වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ ආදහනාගාර සඳහා යොදා ගන්නා 37.5kg ක ගෑස් සිලින්ඩර් වල මිල රටේ පවතින වත්මන් වාතාවරණය මත ඉහල යන බැවින්ද,ආදාහනාගර කටයුතු සඳහා ගෑස් අත්‍යවශ්‍ය බැවින්ද ඒවා වෙළඳපල පවතින මිල ට මිලදී ගැනීම සුදුසු බවට ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා යෝජනා කරන ලදී. එම **යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.**

iv. වයඹ පලාත් විගණන කලමනාකරණ කමිටුවේ උපදෙස් පරිදි සේවක ණය අත්තිකාරම් ගිණුමක් ආරම්භ කිරීම සුදුසු බවත් ඒ සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවටත් ගරු සභාපතිතුමා ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

දැනට එවැනි ගිණුමක් සභාවේ නොමැතිදැයි ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා විමසා සිටින ලදී.

නොමැති බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

තීරණ අංක 09

වයඹ පලාත් විගණන කලමනාකරණ කමිටුවේ උපදෙස් පරිදි සේවක ණය අත්තිකාරම් ගිණුමක් ආරම්භ කිරීම සුදුසු බවත් ඒ සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවත් ගරු සභාපතිතුමා යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ස්ථිර කරන ලදී.ඒ අනුව ඒ සඳහා ගරු මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

## **04. කාරක සහා වාර්තා සලකා බැලීම.**

i. 2022.04.01 වන දින පැවති මාර්ග,ඉඩම්,ගොඩනැඟිලි හා කාර්මික සේවා කාරක සහා වාර්තාව සලකා බැලීම.

වැඩි වූ rates තවමත් පැමිණ නොමැතිදැයි ගරු සභාපතිතුමා ලේකම්මහතාගෙන් විමසා සිටින ලදී.

නව rates නොමැති බැවින් තාක්ෂණ නිලධාරීන් ඇස්තමේන්තු සකස් කිරීමට නොහැකිව වැඩ කටයුතු සිදු නොකරන බව ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.මේ සඳහා හැකි ඉක්මනින් විසඳුමක් ලබා ගත යුතු බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

අප බල ප්‍රදේශයේ වැඩ කටයුතු අඛණ්ඩව සිදු වන බැවින් ලබන සතිය වන විට අප සභාවට පමණක් හෝ නව rates ලබාදෙන ලෙසට ඉල්ලීමක් සිදු කරමුයැයිද ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

තීරණ අංක 10

2022.04.01 වන දින පැවති මාර්ග,ඉඩම්,ගොඩනැඟිලි හා කාර්මික සේවා කාරක සහා වාර්තාව සත්‍ය වාර්තාවක් බව ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතාගේ සහ ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සහා සම්මත විය. ඒ අනුව එම වාර්තාවේ සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා මහා සභාවේ ඒකමතිකව අනුමැතිය ලබා දෙන

ලදී.

## 05.ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ එකතු කල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සළකා බැලීම.

මෙහිදී මතක් කිරීමක් සිදු කරන බවත්,මෙම ආදායම් වියදම් වාර්තා න්‍යාය පත්‍රය සමඟ මන්ත්‍රීවරුන්ට ලැබිය යුතු බවත් ගරු මන්ත්‍රී සී.පී. සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී. කාලය ප්‍රමාණවත් නොවීම වැනි ගැටළු ඉදිරිපත් නොකරන ලෙසත්, සේවක වැටුප් යටතේ විශාල මුදලක් ගෙවීම් සිදු කර ඇති බවත් තවදුරටත් ප්‍රකාශ කල අතර ආදායම් වියදම් වාර්තාව සභාවට යොමු කර සම්මත නොවුනහොත් මහා සභා වාර්තාව අසම්පූර්ණ බවත් එය රීති වලද සඳහන් වී ඇති බවත් ප්‍රකාශ කරන ලදී. මෙය චෝදනාවක් නොව මතක් කිරීමක් බවත්, නිලධාරීන්ගේ වගකීමක් බවත් නිදහසට කාරණා කීමට ඔවුන්ට ඉඩ ලබා නොදෙන ලෙසටද ප්‍රකාශ කරන ලදී.

**i. මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය -2022** මාර්තු

**ii. මාසික ඒකාබද්ධ ගෙවීම් සාරාංශය -2022** මාර්තු

තීරණ අංක 11

2022 වර්ෂයේ මාර්තු මස ඒකාබද්ධ ලැබීම් සාරාංශය සහ 2022 වර්ෂයේ මාර්තු මස ඒකාබද්ධ ගෙවීම් සාරාංශය පිළිබඳ වාර්තා සත්‍ය වාර්තා බව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්. කිත්සිරි අභයවික්‍රම මහතාගේ හා ගරු මන්ත්‍රී යූ.ජුඩ් එම්මානුවෙල් මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය.

**iii. 2022 අප්‍රියෙල් මස ඉන්ධන හා අළුත්වැඩියා වෙනුවෙන් වියදම් වූ වාර්තාව සලකා බලන ලදී.**

**iv. 2022 වර්ෂයේ අප්‍රියෙල් මස වීථි පහන් නඩත්තු කිරීම පිළිබඳ ප්‍රගති වාර්තාව සලකා බලන ලදී.**

## 06. වෙනත් කරුණු ඉදිරිපත් කිරීම.

(i). ගරු මන්ත්‍රී යූ. ජුඩ් එම්මානුවෙල් මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව , 1985 වර්ෂයේ තමන් මැ/දූම්මලදෙණිය ප්‍රදේශයේ නිවස සෑදීම ආරම්භ කළ බවත්, එවිට තමන් කිසිදු දේශපාලනයකට පිය උරුමයෙන් හෝ මව් උරුමයෙන් උරුමයක් ලද පුද්ගලයෙකු නොවන බවත් ප්‍රකාශ කරන ලදී. 1987 දී නිවස ගොඩනගා අවසන් කළ බවත් , 1990 දී එවකට පැවති දේශපාලන වාතාවරණය පිළිබඳ වසර 05 ක අධ්‍යයනයකින් පසුව ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සමඟ එකතු වී එතැන් පටන් 2018 පලාත් පාලන මැතිවරණය වන තෙක් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ දේශපාලන ක්‍රියාකාරිකයෙකු ලෙස වැඩ කටයුතු සිදුකළ බවත් ප්‍රකාශ කරන ලදී . විවිධ ආකාරයේ දේශපාලන තනතුරු තමන් දැරූ බවත් , ජ්‍රොඩ්ෆ්‍රි ප්‍රනාන්දු මැතිතුමාගේ 1994 අගෝස්තු 16 වන දින ජයග්‍රහණයෙන් පසුව තමන් එතුමාගේ පාර්ලිමේන්තු කටයුතු ලේකම්වරයා ලෙස මාස 03 ක් හා දින ගණනක් කටයුතු කළ බවත් , 1982 සිට ජාතික ජල සම්පාදන හා ජල ප්‍රවාහන මණ්ඩලයේ ස්ථිර නිලධාරියෙකු ලෙස සේවය කළ බවත් , 2004 වර්ෂයේ ගරු අරුන්දික ප්‍රනාන්දු මැතිතුමාගේ පලාත් සභා ජයග්‍රහණයත් සමඟ එතුමාගේ ඇඩ් ඉල්ලීම මත තමන් එතුමාගේ පෞද්ගලික ලේකම්වරයා ලෙස කටයුතු සිදුකළ බවත් ප්‍රකාශ කරන ලදී.

තම නිවස සෑදීමට බැංකුවෙන් ඇරුණු කොට වෙනත් කිසිදු ආකාරයකින් කිසිවෙකුගේ මුදල් යොමු කර නොමැති බව ගරු මන්ත්‍රී යූ. ජූඩ් එම්මානුවෙල් මහතා ප්‍රකාශ කරන ලදී. එවැනි වූ කාර්යයක් නිමකල තමන්ට, කිසිවෙකුට හිංසාවක් සිදු නොකළ තමන්ට පසුගිය 9 වන දින සවස 06.05 ට පමණ තම දරුවන් දෙදෙනා නිවසේ සිටියදී ගේට්ටුව කඩාගෙන ඇතුළට ගොස් නිවස වටේම ජනෙල් දොරවල් සියල්ල කඩා දැමූ බවත් , රූපවාහිනී යන්ත්‍රය, LAPTOP පරිගණකය හා ගෑස් සිලින්ඩරයට පවා සිදු වූ දෙයක් නොමැති බවත් ප්‍රකාශ කරන ලදී. 1990 සිට ක්‍රියාකාරී දේශපාලනයක් සිදු කල තමන්ට කෙදිනකවත් මෙලෙස පීඩනයක් එල්ල වී නොමැති බවත් , එයට හේතුව නම් තමන් අනුභව කරමින් සිටියදී වුවද දිවුරුම් පෙත්සමක් ගැනීමට පැමිණෙන අයෙකුට කෙදිනකවත් රස්තියාදු නොකිරීම බවත් , ප්‍රකාශ කරන ලදී. කිසිදු දෙයක අගක් මුලක් නොමැතිව මෙම ප්‍රහාරය එල්ල කිරීම අතිශය කණගාටුදායක බවත්, මෙලෙස දේශපාලනය කරන අයටද මෙලෙස සිදුවන්නේ ඇයි දැයි සිතෙනා බවත්, සමාජය පිළිබඳව තමන්ට විශාල කලකිරීමක් තිබෙන බවත් ප්‍රකාශ කරන ලදී පසුගිය කාලවකවානුවේදී තම පුතනුවන් අරගලය පිළිබඳව දැවැන්ත ලෙස වර්ණනා කළ බවත්, ඒ පිළිබඳව තමන් සමඟද කතා කළ බවත්,මෙය රටේ ගැටළුවක් බවත් තාත්තේ මේක තේරුම් ගන්න යනුවෙන්ද තමන්ට පැවසූ බවත්, නමුත් අද වන විට අරගලය යනු මෙයදැයි ඔහු විසින් විමසා සිටින බවත් ප්‍රකාශ කරන ලදී. මේ පිළිබඳව දීර්ඝව කතා නොකරන බවත්, වෙන්නප්පුව මැතිවරණ කොට්ඨාසයේ නායකතුමා වන ගරු රාජ්‍ය අමාත්‍ය අරුන්දික ප්‍රනාන්දු මැතිතුමාගේ, ගරු ට්‍රෙවින් ප්‍රනාන්දු මැතිතුමාගේ හා අප සභාවේ ගරු සභාපති තුමා ඇතුළු අනෙකුත් ගරු මන්ත්‍රීවරුන්/ වරියන් මෙම බල ප්‍රදේශයට කෙතරම් සේවාවක් සිදු කළේ යැයිද, එබැවින් ආණ්ඩුවක් බලයේ සිටියදී බල ප්‍රදේශයේ ජනතාව පුංචි ආණ්ඩුව සෑදීමට ඡන්දය ලබා දුන් බවත් ප්‍රකාශ කරන ලදී.

ඡන්දය දුන් ජනතාවට නැවත නැවතත් ස්තූතිවන්ත වන බවත්, මෙවැනි පුද්ගලයින්ද අප සමග සිටින බැවින් විශාල කම්පාවක්, දුකක් තමන්ට තිබෙන බවත්, අධිකරණයේ ක්‍රියාත්මක වන නඩුවක් තිබෙන බැවින් මෙම සිද්ධිය පිළිබඳ දීර්ඝව කතා නොකරන බවත් ප්‍රකාශ කරන ලදී.දේශපාලනික වශයෙන් තමන් උපයාගත් දෙය නම් තම නිවස පිහිටි පර්.80 ක ඉඩම මේ වන විට පර්.47 ක් දක්වා අඩු වී ඇති බවත්, විවිධ ආකාරයේ මැතිවරණ සඳහා වියපැහැදම් වන විට තමන් සිදු කළ දෙය එය බවත් ප්‍රකාශ කරන ලදී. දහසක් පැතුම් සිතේ තබාගෙන ඡන්දය ලබාදුන් සියළු දෙනාටම සදාණයගැතියැයි පවසමින් තම කතාව අවසන් කරන ලදී.

(II). ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව පසුගිය 09 වන දින අරගලයට පහරදුන් බවත්,එය ආදරයේ අරගලය ලෙස නම් කර තිබූ බවත්, මෙම සභාවේ සිටින විපක්ෂ ආණ්ඩුපක්ෂ ගරු මන්ත්‍රිවරුන්ගේ සහෝදර සහෝදරියන්,නෑදැයින්ද එම අරගලය භූමියට ගොස් ඡායාරූප,වීඩියෝ දර්ශන දැමූ බවත්,නමුත් එම ආදරයේ අරගලයට රාජ්‍ය ත්‍රස්තවාදය පැමිණ ප්‍රහාරය එල්ල කල බවත්, අරලියගහ මන්දිරයේ සිට එම මැර පිරිස පැමිණි බවත් ප්‍රකාශ කරන ලදී.එයට සෘජුවම මෙම රජයේ අමාත්‍යවරුන් සම්බන්ධ බවත් ඒ සියල්ල තිබියදී ජනතා විමුක්ති පෙරමුණට චෝදනා එල්ල කරමින් පසුගිය සිදුවීම් පිළිබඳව කතා කරන බවත් ප්‍රකාශ කරන ලදී.අරගලයේදී මියගිය ප්‍රහාර වලට ලක් වූ පිරිසක් සිටින බවත් මෙම දුකම අත් වූ දෙමාපියන් සිටින බවත් ඒ සියළුම දෙනාට ජනතා විමුක්ති පෙරමුණේ සහ වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ කණගාටුව ප්‍රකාශ කරන බවත් පවසා සිටින ලදී.ජනතා විමුක්ති පෙරමුණ පක්ෂයක් ලෙස මෙම කිසිඳු ප්‍රචණ්ඩක්‍රියාවකට අනුබල දීමක් සිදු කර නොමැති බවත්, එමෙන්ම ගරු සභාපතිතුමා විසින් තමාව ඉලක්ක කර සිදු කල ප්‍රකාශය මෙම සභාව නොමඟ යවන ප්‍රකාශයක් බවත් කරුණාකර එය ඉවත් කර ගන්නා ලෙසත් ඉල්ලා සිටින ලදී. තමාව ඉලක්ක කර පැවසීමට සාක්ෂි තිබේනම් නීතිමය පියවර ගන්නා ලෙසටද ඉල්ලා සිටින ලදී.

ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරුන් 27ක් කොළඹ ගියායැයි මුහුණු පොතේ සටහන් කර තිබූ බව ගරු මන්ත්‍රී ඒ.රෙක්ෂි ප්‍රභාත් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

එය තමන් දැමූ බවත්,එහි තිබෙන නීතිමය තත්ත්වය පිළිබඳව ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා විමසා සිටින ලදී.

එය ජනතාව දුටු පළමු පණිවිඩය බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

එය තමන් උදැසන කාලයේ දැමූ බවත්,නමුත් එම අවස්ථාවේදී මෙවැනි සිදු වීමක් පිළිබඳව දැන නොසිටි බවත් ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී.

ඝෝෂාව....

මන්ත්‍රීවරුන් 27 ලෙස පැවසුවද,සභාවේ ආණ්ඩුපක්ෂයේ මන්ත්‍රීවරුන් 24ක් පමණක් සිටින බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා තමන් මුහුණු පොතේ සඳහන් කල පණිවිඩය ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

එය බොරු පණිවිඩයක් බවත්,තමන් සමඟ ගරු මන්ත්‍රීවරුන් 4 දෙනෙකු පමණක් සහභාගී වූ බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

එහි මන්ත්‍රීවරුන් ලෙස නොව 27 දෙනෙකුගේ කණ්ඩායමක් ලෙස සඳහන් කරඇති බව ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී.

ඝෝෂාව....

හිටපු අග්‍රාමාත්‍ය ගරු මහින්ද රාජපක්ෂ මහතා රැකීමට ගියායැයි තමන් සඳහන් කල බවත් එහි ගියේ ඒ සඳහා නොවේදැයිද ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා විමසා සිටින ලදි.

අගමැතිතුමා රැකීමට නොගිය බවත්,සභාවේ මන්ත්‍රීවරුන් 24 දෙනෙකු සිටියදී සාවද්‍ය පණිවිඩ ලබාදෙන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

තමාට ලැබුණ පණිවිඩය එලෙස තමන් දැමූ බව ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී.

එය පළමුවෙන්ම ජනතාව බෙදා හල බවත් , පළමු කතිකාව එම පණිවිඩය නිසා ජනතාව අතර ගිය බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ඝෝෂාව.....

එසේ නම් ජනතාවට තොප්පුවට පැමිණෙන ලෙස පැවසුවේ මන්දැයිද ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා විමසා සිටින ලදී.

එම තොරතුරු සියල්ලම තමා සතුව තිබෙන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

නීතිඥ මහතුන් මෙහි සිටින බවත්, නිවැරදිව තොරතුරු සොයා බලා විමර්ශනය කර පරීක්ෂණය කරන ලෙසත්, තමන් වැරදිකරුවෙකු නම් දඬුවම් ලබා දෙන ලෙසත් ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී. කිසිවෙකුට පහරදෙන ලෙසට එක් වචනයක් හෝ තමන් පවසා නොමැති බවත්, තම දුරකථන ඇමතුම්ද ගෙන බලන ලෙසත් එම පහර දීමට යන පිරිසටද තමන් පැවසුයේ උද්ඝෝෂණය කරන ලෙසට බවත් ප්‍රකාශ කරන ලදී. තොප්පුවේ පැය 4ක පමණ කාලයක් තමන් රැඳී සිටි බවත්, එම පිරිසව නතර කිරීමට කිසිවෙකුට නොහැකි බවත්,ගරු පියතුමන්ලා තිදෙනෙකු සහ ගරු ස්වාමින්වහන්සේ නමක් එතැන සිටි බවත්, පොලීසිය,බුද්ධි නිලධාරීන්ද එතැන සිටි බවත් ප්‍රකාශ කරන ලදී. එමෙන්ම 3000ක පමණ පිරිසක් එතැන සිටි බවත්,තමන් එතැනින් පිටව නිවස වෙත පැමිණෙන විට හිටපු සභාපති ගරු ප්‍රෙවින් ප්‍රනන්දු මහතාගේ නිවස ගිණි ගන්නා බවත් එතැනද පොලීසියේ නිලධාරීන් රැසක් බලාගෙන සිටි බවත් ප්‍රකාශ කරන ලදි.

මෙම අවස්ථාවේ ගරු මන්ත්‍රී එස්.එම්.සුදත් චන්දන මහතා තම දුරකථනයෙන් පටිගත කිරීමක් සිදු කරමින් සිටි අතර එහිදී එයට තමාගෙන් අවසර ලබා ගත යුතු බවත් පළමුව එය දුරකථනයෙන් මකා දමන ලෙසත් ගරු සභාපතිතුමා දැනුම් දෙන ලදී.

ගරු සභාපතිතුමන්ලා පසු සිදුවීම පිලිබඳ කතා කරන බවත් නමුත් වගකිවයුතු ආණ්ඩුවක් ලෙස කතා කල යුතු බවත්, මෙම ආණ්ඩුවට ජනවරමක් ලැබී ඇති බවත්, ආණ්ඩුවේ ඇමතිවරුන්ද එම පහර දුන් ස්ථානයේ සිටි බවත් ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී.

අරගලයට විරුද්ධ නොවන බවත්,තමන්ලාද ජනතාවට තිබෙන ආර්ථික ගැටළුවට පිළිතුරක් ලබාදෙන ලෙසට නායකයින්ට පැවසූ බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. මෙය දේශපාලනමය ගැටළුවක් නොවන බවත් නමුත් එය දේශපාලන ගැටළුවක් බවට පරිවර්ථනය කර ගන්නා බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමාගේ කතාවේදී ගරු සභාපතිතුමාට එක් වචනයක් හෝ තමන් නොපැවසුව බවත්,තමාට කතා කිරීමට අවස්ථාව ලබාදෙන ලෙසත් ගරු මන්ත්‍රී ටී.බී.ඕ.ඇන්ටනී කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී. මයිනාගෝගම සිටි පිරිසට පියතුමන්ලාට,කාන්තාවන්ට පහර දුන් බවත්, ඒවා දුටු ජනතාවගේ සිතට එය දැනුන බවත් මන්ද එම ස්ථාන වලට ලක්ෂ ගණනක් ජනතාව සහභාගී වූ බවත් එබැවින් පහරදෙන බව දැනගත් විට ජනතාවට එය දැනුනු බවත් එවිට ජනතාව එක්රැස් වූ බවත් ප්‍රකාශ කරන ලදී.එම සිදුවීම් වලින් පසුව අනෙක් සිදුවීම් සිදු වූ බවත්, අනිවාර්යයෙන්ම මෙය සංවිධානාත්මකව සිදු වූ බවත් ඒවා ද සොයා බලන ලෙසත් ප්‍රකාශ කරන ලදී.අතිගරු ජනාධිපති ගොඨාභය රාජපක්ෂ මැතිතුමා මීට පෙර අප රටේ සිටි ආරක්ෂක ලේකම්වරයා බවත්, හොඳම බුද්ධි අංශය අප සතුව තිබෙන බව පැවසූ බවත්, ත්‍රිවිධ හමුදාව පොලීසිය තිබෙන බවත් ප්‍රකාශ කරන ලදී. ගරු රාජ්‍ය අමාත්‍ය අරුන්දික ප්‍රනාන්දු මැතිතුමාගේ නිවසට ගිණි තබන විට පොලිස් නිලධාරීන් 50ක් පමණ එතැන සිටි බවත්, නීතිය ක්‍රියාත්මක නොකලේ මන්දැයිද විමසා සිටින ලදී.

ජනතා විමුක්ති පෙරමුණ ලෙස මෙම කිසිඳු ගිණි තැබීමක් පහර දීමක් අනුමත නොකරන බවත්,දේශපාලනය ප්‍රජාතන්ත්‍රවාදීව සිදු කරමුයැයිද නමුත් ම්ලේච්ඡ ලෙස එලෙස පහර එල්ල කර පසුව චෝදනා නොකරන ලෙසද ගරු මන්ත්‍රී ටී.බී.ඕ.ඇන්ටනී කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී.මිරිහාන සිද්ධියෙන් පසුදින ප්‍රසිද්ධියේ ප්‍රසන්න රණතුංග ගරු ඇමතිතුමා ජනතා විමුක්ති පෙරමුණ එයට සම්බන්ධයැයි පැවසුවද අද වන විටත් කිසිවෙකුව අත්අඩංගුවට ගෙන නොමැති බවත්, ඒවා නොකර දේශපාලනිකව පළි නොගන්නා ලෙසත් ප්‍රකාශ කරන ලදී.එමෙන්ම තමන්ගේ අමාත්‍යවරුන් විසින් සිදු කල වරද ජනතා විමුක්ති පෙරමුණ මත නොපටවන ලෙසද තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

වෙන්නප්පුවේ ගරු මන්ත්‍රීවරුන්/වරියන් එලෙස කටයුතු සිදු නොකල බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

නුගේගොඩ ජනරැලියට ලක්ෂ ගණනක් ජනතාව පැමිණි බවත්,එහිදී කිසිවෙකුවත් එකඳු ගල් කැටයක් හෝ රැගෙන නොපැමිණි බවත්,එලෙස සංවිධානාත්මකව සිදු කල සෑම උද්සෝෂණයක්ම ඉතාමත් සාමකාමීව සිදු කල බවත් එමෙන්ම වෙන්නප්පුව බස් ස්ටෑන්ඩ් එකේ උද්සෝෂණයද එලෙසම සිදු කල බවත් ආණ්ඩුවට විරුද්ධව රට වටා උස්සෝෂණ රැසක් සිදු කල බවත් ඉන් කිසිඳු ස්ථානයක මෙලෙස සිදු නොවූ බවත් ගරු මන්ත්‍රී ටී.බී.ඕ.ඇන්ටනී කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී. ජනතාවට පීඩනයක් තිබෙන බවත්,තමන්ද බැංකු ණයකින් නිවස සාදාගෙන සිටින බවත් එබැවින් කිසි විටක තවත් පුද්ගලයෙකුගේ නිවසක් කුඩු කිරීමට තමන් ද අකමැති බවත් ප්‍රකාශ කරන ලදී.ගරු අමාත්‍ය සනත් නිශාන්ත මහතාගේ ජගත් සමන්ත නම් පුද්ගලයා ගැහැණු ළමුන් දෙදෙනෙකුගේ බෙල්ලට කඩුව තැබූ බවත්,ඒවා පිළිබඳ කිසිවෙකු කතා නොකරන්නේ එතුමා තම පක්ෂයේ ඇමතිතුමෙකු බැවින්යැයිද විමසා සිටින ලදී. ඒවාටද නීතිය ක්‍රියාත්මක කරන ලෙසත්,ඔවුන් අත්අඩංගුවට ගන්නා ලෙස සාමකාමී උද්සෝෂණයක් ආරච්චිකට්ටුව නගරයේ සිදු කල බවත්,ඒවාටත් කතා කරන ලෙසත් ප්‍රකාශ කරන ලදී. ඒවාද වැරදි බවත්,ජනතා විමුක්ති පෙරමුණටම ඇඟිල්ල දික් නොකරන ලෙසත් තමන්ට ගරු සභාපතිතුමා සමඟ කිසිඳු ප්‍රශ්නයක් නොමැති බවත් සියළුම දෙනා දේශපාලනය සිදු කරන බවත් පෞද්ගලිකව නිවෙස් වලට පහර දීමට අදමයෝවත් ගරු සභාපතිතුමා සඳහන් කල පරිදි ගෝත්‍රිකයෝවත් නොවන බවත් මෙය දියුණු සමාජයක් බවත් ප්‍රකාශ කරන ලදී.අද වන විට තරුණ පිරිස බොහෝ ඉදිරියෙන් සිටින බවත්, ගරු සභාපතිතුමන්ලාගේ නායකයින් දශක ගණනක් පිටු පසින් සිටින බවත් තරුණයින් මර්ධනය කල විට නිදා ගනිතියැයි සිතුවද අද වන විට එවැනි සමාජයක් නොමැති බවත් ප්‍රකාශ කරන ලදී. වෙන්නප්පුවේ අත්අඩංගුවට ගෙන තිබෙනුයේ අහිංසකයින් බවත්, ඔවුන් පාරේ සිටින වීඩියෝ දර්ශන තිබෙන බවත් දහස් ගණනක් ජනතාව පාරේ සිටි බවත් ප්‍රකාශ කරන ලදී.

අධිකරණයේ ක්‍රියාදාමය අධිකරණයෙන් සිදුවේයැයිද ඒ පිළිබඳව කතා නොකරන ලෙසත් ගරු සභාපතිතුමා දැනුම් දෙන ලදී.

1997 වර්ෂය සිට ජනතා විමුක්ති පෙරමුණේ ක්‍රියාකාරී සාමාජිකයින් 7 දෙනෙකු මරා ඇති බවත්,නඩු දමා තිබුනද ඒවා ක්‍රියාත්මක නොවන බවත්,ඇමතිවරුන්ට විරුද්ධව නඩු දැමුවද මේ වන තෙක් කිසිවෙකු අත්අඩංගුවට ගෙන නොමැති බවද ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී. එදින සාමාන්‍ය ජනතාව පවුල් පිටින දරුවන් සමඟ පාරට පැමිණි බවත්,මුහුණු ආවරණය කර ගත් හෙල්මට් දැමූ කණ්ඩායමක් පාරට පැමිණි බවත් ඔවුන්ව සොයා ගන්නා ලෙසත් ප්‍රකාශ කරන ලදි.බුද්ධි නිලධාරීන් කීප දෙනෙකු තමා වටාද සිටි බවත්, තමන් කතා කල දේ ඔවුන් දන්නා බවත් මේවා පිළිබඳව සොයා බලන ලෙසද ප්‍රකාශ කරන ලදී.

ඝෝෂාව......

අත්අඩංගුවට ගැනීමට යම් මන්ත්‍රීවරුන්ගේ පුතුන්ගේද නම් සමාජ මාධ්‍යයේ තිබෙන බවත් ඔවුන් අත්අඩංගුවට නොගන්නේ මන්දැයිද ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා විමසා සිටින ලදී.

ඒ සියල්ලම සොයා බලන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

දංකොටුවේ මැක්ෂි දබරේරා මහතාව අත්අඩංගුවට ගැනීමට පොලීසිය නිවසට යන බවත්, නමුත් එතුමා ඉතාලියේ සිටින බවත්, මේ වන විට ලැයිස්තුවෙන් ඔහුගේ නම ඉවත් කර ඇති බවත් එලෙස සැකකරුවන් සොයනා බවත් ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී. එමෙන්ම පොලිස්පතිතුමා ස්ථාන 184කින් 182ක්ම දේශපාලන පත්වීම් බව පවසන බවත් එසේනම් OIC මහතුන්ද දේශපාලන පත්වීම් දැයිද විමසා සිටින ලදී.

ආණ්ඩුපක්ෂයේ සංවිධායකගෙන් ලිපියක් ඉල්ලන බවත්, එය නීතිය බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

විසිවන සංශෝධනයෙන් පොලිස් කොමිසම නැති කර අවශ්‍ය පිරිසව දමාගත් බව ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ප්‍රකාශ ලදී.

නඩුදමා නීතිය ක්‍රියාත්මක කරන ලෙසත්, මානව හිමිකම් කොමිසම ඉදිරියට සියළුම දෙනා යන ලෙසත් සාක්ෂි ඉදිරිපත් කර වරද කරුවන් කරන ලෙසත් එසෙ නොමැති නම් වන්දි ඉල්ලා නඩු දමනා බවත් අහිංසක පොලිස් නිලධාරීන්ද ඒවාට පැටලෙන බවත් ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී.

ඔබතුමන්ලාගෙ කණ්ඩායමේ පිරිස ගිණි නොතිබ්බේ නම් මෙලෙස හැසිරෙන්නේ මන්දැයි ගරු මන්ත්‍රී ඒ.රෙක්ෂි ප්‍රභාත් ප්‍රනාන්දු මහතා විමසා සිටින ලදී.

සිදු කල චෝදනාවට මෙලෙස පවසන බව ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී.

මොවුන් බොරදියේ මාළු බාන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

150ක් සැකකරුවන් සිටින බවට ගරු රාජ්‍ය අමාත්‍ය අරුන්දික ප්‍රනාන්දු මැතිතුමා පවසන බවත්,එසේ නම් නාම ලේඛණයක් ඉදිරිපත් කරන ලෙසත්, මෙතැනද නීතිඥවරුන් සිටින බවත් ඔවුන්ගේ හෘද සාක්ෂිය එය දන්නා බවත් ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී.එමෙන්ම වරදක් සිදු නොකල කෙනෙකු කූඩුවට දැමූ විට ඔහුට හා දරුවන්ට කෙතරම් වේදනාවක් තිබේදැයිද,ඒවා අනුමත නොකරන බවත් පවසමින් තම කතාව අවසන් කරන ලදී.

තමන් සමඟ ගරු රාජ්‍ය අමාත්‍ය අරුන්දික ප්‍රනාන්දු මැතිතුමා සම්බන්ධ නොවුන බවත්, එතුමා සම්බන්ධ වුයේ නම් තොරතුරු ලබාදීමට තිබූ බවත්, පෙරටුගාමී පක්ෂයේ ප්‍රධාන සංවිධායක පහර දීමට තම නිවසට පළමුව ඇතුළු වූ බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

(III). ගරු උපසභාපති ආර්.ඒ.නිලංක සඳකැල් මහතා ගරු සභාපතිතුමා,ගරු විපක්ෂනායකතුමා ඇතුළු සියළු දෙනාගෙන්ම අවසර ගැනීමෙන් පසුව අද වන විට අප රටේ පවතින තත්ත්වය පිළිබඳව ගරු මන්ත්‍රීවරුන් සහ සියළුම දෙනා දන්නා බවත්, ආර්ථික අර්බුදයක් තිබෙන බවත් ප්‍රකාශ කරන ලදී. අප රට නිදහසින් පසුව පාලනය කල යම් යම් පාලන කාල වල අඩුපාඩු මුල් කරගෙන අප රට මේ තත්ත්වයට පත් වී ඇති බවත් මේ සඳහා පාලනයට පැමිණි නොපැමිණි සෑම කෙනෙකුම වගකිවයුතු බවත්, සියළු දෙනාගේම බදු මුදල් එකතු වී ආණ්ඩුවේ දේපල හානි සිදු වී අද වන විට මුදල් නොමැති

තත්ත්වයට අද රට බංකොලොත් වී ඇති බවත් ප්‍රකාශ කරන ලදී. ආර්ථික අර්බුදය කෙසේ වෙතත් ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ ගරු මන්ත්‍රීවරුන් එදින අරලියගහ මන්දිරයේ රැස්වීමට සහභාගී වූයේ කිසිවෙකුට පහර දීමට නොවන බවත්, පක්ෂයේ නායකයා රට බේරාගත් නායකයාට කතා කොට සමුදීමට බවත් එය වරදක්දැයි ප්‍රශ්නයක් තමාට තිබෙන බවත් ප්‍රකාශ කරන ලදී.එතැනදී සංවිධානාත්මකව සිදු වූ දෙය පිළිබඳව නොදන්නා බවත්,නමුත් තමන් දන්නා නාත්තන්ඩිය, පුත්තලම් දිස්ත්‍රික්කයේ බොහෝ දෙනෙකු එතැනට සහභාගී නොවූ බවත් ප්‍රකාශ කරන ලදී. එතැනදී සිදු වූ සිද්ධිය හෙළා දකිනා බවත්,එයට පහර දීමට මින් පෙරද හැකියාව තිබූ බවත් නමුත් ඒ සඳහා අවශ්‍යතාවයක් නොතිබුණ බවත් මෙම සිද්ධිය පෞද්ගලිකව සියළු දෙනා අනුමත නොකරන බවත් ප්‍රකාශ කරන ලදී.හෙට අප සිටියත් නැතත් කවුරුන් හෝ දේශපාලනය කල යුතු බවත්,එතැන පහර දුන්නායැයි පවසා කිසිවෙකුට නිවෙස් ගිනි තැබීමට,වාහන පරීක්ෂා කිරීමට බලයක් ලබා දී නොමැති බවත් කෙදිනකවත් නොදැකපු පිරිස් මෙලෙස විනාශයක් කල බවත්,මෙය ලංකා ඉතිහාසයේ කළු පැල්ලමක් බවත්,මීට පෙර භීෂණ සමයක් තිබී ඇති බවත් ප්‍රකාශ කරන ලදී.ආණ්ඩු බලය,විධාක බලය තබාගෙන මෙලෙස සිදු වූ බවත්,අතිගරු ජනාධිපතිතුමා විනය ගරුක නායකයෙකු බවත්,එතුමාගේ බලතල වලින් සිදු වූ අඩත්තේට්ටම් තිබේදැයිද විමසූ අතර එදින විශාල හානිය ආණ්ඩුපක්ෂයට සිදු වූ බවත්,වෙනත් විධායක ජනාධිපතිවරයෙකු සිටියේ නම් මෙලෙස නොවන බවත්, නිවසට පැමිණ ගිණි තැබීමේදී තුවක්කුව භාවිතා කිරීමට හැකියාව තිබූ බවත් ප්‍රකාශ කරන ලදී.සිදු වූ දෙය සමඟ මේවාද දැකිය යුතු බවත්,අදටත්රටේ නායකයා නිසොල්මනේ බලා හිඳින බවත් එතුමාට යන ලෙසට පැවසුවද එලෙස දමා යාමට නොහැකි බවත් විසඳුමක් ඒ සඳහා අවශ්‍ය බවත් රට අරාජික කල නොහැති බවත් නමුත් භාර ගැනීමට ද කෙනෙකු නොමැති බවත් ප්‍රකාශ කරන ලදී. හිටපු අග්‍රාමාත්‍ය ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාට කිරීමට නොහැකි නම් වෙනත් අයෙකුට භාර දෙන ලෙසට අප කණ්ඩායමේ 90% දෙනාද අදහස තිබූ බවත් නමුත් භාර දීමට ගිය විට කොන්දේසි දමන බවත් රටේ නීතියක්ද තිබෙන බවත්, පළමුව අගමැතිතුමා ඉවත් විය යුතු බවත් මෙය නොදත් ජනතාව කෙසේ පැවසුවද ඇවිස්සෙන බවත් ප්‍රකාශ කරන ලදී.අතිගරු ජනාධිපතිතුමා ඉවත් වී ගිය පසුව ජනාධිපති වනුයේ කවුරුන්දැයිද විමසා සිටින ලදී,නව අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා පිංවන්තයෙකු බවත්, එතුමාට ජනතා ප්‍රසාධයක්ද තිබෙන බවත් ප්‍රකාශ කරන ලදී. ගරු මන්ත්‍රීවරුන්ගේ නිවෙස් කීපයක්ම විනාශ කල බවත්, ගරුරාජ්‍ය අමාත්‍ය අරුන්දික ප්‍රනාන්දු මැතිතුමාගෙන් නූල් පොටක් හෝ නොගත් කෙනෙකු මෙම ප්‍රදේශයේ නොමැති බවත්,එතුමා කිසිවෙකුව පීඩාවට පත කර නොමැති බවත්,නිහතමානී නායකයෙකු බවත් ප්‍රකාශ කරන ලදී. එතුමා ඇතුළු පාර්ලිමේන්තු මන්ත්‍රී නිරෝශන් පෙරේරා මැතිතුමා,එමෙන්ම හිටපු පාර්ලිමේන්තු අමාත්‍ය මිල්රෝයි පෙරේරා මැතිතුමා පොලොවේ පය ගසා සිටින නායකයින් තිදෙනෙකු බවත් ප්‍රකාශ කරන ලදී.සාමකාමීව කටයුතු කරන පුද්ගලයින්ට අප ආසනය තුළ දේශපාලනය කිරීමට පහසු බවත් ජනතා විමුක්ති පෙරමුණේ ගරු මන්ත්‍රීතුමා ගරු අමාත්‍ය සනත් නිශාන්ත මැතිතුමාගේ සිද්ධියක් පිළිබඳව පැවසුව බවත් ඇත්තෙන්ම ඒවා පිළිබඳව නොදන්නා බවත් එවැනි දෙයක් සිදු වී ඇත්නම් ඒවාද සිදු නොවිය යුතු බවත් අරගලයේ සිදු වූ සිද්ධිය වැරදි බවත්, නමුත් එයට මෙම සිද්ධිය සමාන කල නොහැති බවත් ප්‍රකාශ කරන ලදී. වාහනයක් තම මහන්සියෙන් ගත්, නිවෙසක් දුක් මහන්සියෙන් සාදා ගත් අයෙකු කිසි දිනක එලෙස විනාශයක් කිරීමට එක් ගිණිකූරක් හෝ නොදල්වන බවත් ප්‍රකාශ කරන ලදී.මන්ත්‍රීවරුන් ලෙස සියළු දෙනා තමා සතු දේද සමාජයට ලබා දී වැඩ කටයුතු කල බවත්, මෙහිද වසර ගනනාවක් වැඩ කල මන්ත්‍රීවරුන් සිටින බවත්,ව්‍යාපාරයක් කලේ නම් ගරු සභාපතිතුමා අද වන විට වෙන්නප්පුවේ සිටින ලොකුම කෝටිපතියා බවටද පත් වීමට තිබූ බවත් මෙවැනි ක්‍රියා සිදු නොවිය යුතු බවත් ප්‍රකාශ කරන ලදී.හෙට කිසිවෙකු දේශපාලනට පැමිණ මෙම තත්ත්වය තිබුණහොත් එය රටට විශාල අභාග්‍යයක් බවත් වරද කවුරුන් කලේද යන්න වැදගත් නොවන බවත් ප්‍රකාශ කරන ලදී.හිටපු සභාපති ගරු ට්‍රෙවින් ප්‍රනාන්දු මහතාගේ නිවස වසර ගණනාවකට පෙර සෑදූ නිවෙසක් බවත්, එතුමාට මෙම සිද්ධියෙන් පසුව ඇඳි වත පමණක් ඉතිරි වූ බවත්, එමෙන්ම ගරු රාජ්‍ය අමාත්‍ය අරුන්දික ප්‍රනාන්දු මැතිතුමාව තමන් පෞද්ගලිකව දන්නා බවත්, එතුමාගේ ඥාතීන්ද මෙම සභාවේ සිටින බවත්,එතුමාට හෙට දින නිවසට ගියහොත් ගමනක් යාමට බයිසිකලයක්වත් නොමැති බවත් පෞද්ගලිකවයැයි කිවහැකි කිසිවක් එතුමාට නොමැති බවත් ප්‍රකාශ කරන ලදී. එමෙන්ම ගරු මන්ත්‍රී එල්.දිනේෂ් චන්දන පෙරේරා මහතාගේද දෙමාපියන් සහ සහෝදරයන් විසින් ඉදිකල නිවෙස තිබෙන බවත් මෙම සියළුම දෙනා යමක් හම්බ කලේනම් එය සමාජයට ලබා දී ඇති බවත්,මෙහි සිටින සියළු දෙනාම විපක්ෂයේ මන්ත්‍රීවරුන්ද එලෙසම බවත් ප්‍රකාශ කරන ලදී.දේශපාලනය කරමුයැයිද නමුත් හෙට නිවෙසට ගොස්

පාරට බැසිය යුතු බවත් අරගලයට ගැසුවේයැයි පවසා මෙලෙස විනාශයක් කිරීමට කිසිවෙකුට බලය ලබා දී නොමැති බවත් ප්‍රකාශ කරන ලදී.ජනතා විමුක්ති පෙරමුණේ ගරු මන්ත්‍රීතුමා අරගලයට ගැසූ නිසා මෙලෙස සිදු වූවායැයි අදහස් කල බව තමාට හැඟුන බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

තමන් එලෙස අදහස් නොකල බවත්, තමන් මෙම සිදුවීම් දෙකටම කණගාටුව ප්‍රකාශ කල බවත් ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී.

දඬුවම් ලැබිය යුතු බවත්, ඉදිරියේදී රට භාර ගැනීමට සිටින තරුණ පිරිස බුද්ධිමත්යැයි සිතනා බවත්, නමුත් දේශපාලන වශයෙන් සහ සමාජ වටපිටාව වශයෙන් පිරි හී ඇති බවත් ගරු උපසභාපති ආර්.ඒ.නිලංක සඳකැල් මහතා ප්‍රකාශ කරන ලදී.අධ්‍යාපන පසින් ඉහළටම ගියද යම් යම් දේ වලින් ඔවුන් පහළට යන බවත්,ගරු සභාපතිතුමා, ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා, ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත මහතා,ගරුමන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතා, ගරු මන්ත්‍රීනී ජේ.කේ.දීපා මේරි අයිරංගනී පෙරේරා මහත්මිය යන ගරු මන්ත්‍රීවරුන්/වරියන්ගේ නිවෙස් මේ තත්ත්වයෙන් හෝ බේරුණ බවත්, ඒවාටද ගිණි තැබුවේනම් කුමක් සිදු වේදැයිද විමසා සිටින ලදී.මඩ ප්‍රහාර මිස ඔප්පු කිරීමට සාධක නොමැති බවත්, දේශපාලනයෙන් හෙට ගෙදර ගියද ගැටළුවක් නොවන බවත්, මෙවැනි ආදර්ශ මින් ඉදිරියට ලබා නොදෙමුයැයිද දේශපාලනයේදී පාක්ෂිකයින් සමඟ යම් අරගල සිදු කරමුයැයිද කිරිමැටියානේද තමන් එවැනි ගැටළු මැදිහත් වී විසඳා ඇති බවත් ප්‍රකාශ කරන ලදී.තම නායකයා පිළිබඳව විශේෂයෙන්ම කතා කල යුතු බවත්, එතුමා කිසි දිනක අඩත්තේට්ටම් කිරීමට කතා නොකල බවත්, පක්ෂය ගොඩ නැගීමට කටයුතු කල බවත්, ජනතාවට පෞද්ගලිකව හෝ දේශපාලන වශයෙන් උදව් උපකාර කල බවත් හෙට ගෙදර ගියද මේ සියළුම දෙනා මරණ මංචකයට වැඩ කටයුතු සිදු කරගෙන තිබෙන බවත් දේශපාලනය කර නින්ද නොයන්නේ නම් එය අභාග්‍යය බවත් ප්‍රකාශ කරන ලදී. මේවා අනුමත නොකරන බවත්, මින් ඉදිරියට මෙලෙස දේශපාලන සංස්කෘතියක් ගොඩනැඟිමට ඉඩ ලබා නොදෙමුයැයිද පවසමින් වැදගත් ලෙස මෙම ගමන යාමට උත්සාහ කරමුයැයිද පවසමින් තම කතාව අවසන් කරන ලදී.

(IV). ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ගරු සභාපතිතුමා,ගරු උපසභාපතිතුමා ඇතුළු ආණ්ඩුපක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රීවරුන්/වරියන්ගෙන් අවසර ගැනීමෙන් පසුව පසුගිය මැයි 09 වන දින ඉතාමත් අභාග්‍යසම්පන්න සිද්ධියක් සිදු වූ බව ප්‍රකාශ කරන ලදී. ගොඨාගෝගම යනුවෙන් ස්ථානයක් පවත්වාගෙන යාමෙන් මේ රටට මේ වන විට සිදු වී ඇති අගතිය දන්නේදැයිද විමසා සිටින ලදී.පිටරටවල සිටින උදවිය රූපවාහිනිය දැමූ විගස ශ්‍රී ලංකාව ගෝත්‍රික සමාජයක් ලෙස ඔවුන් දකිනා බවත් එම නිසාම හෝටල් හිමියන් පවසන පරිදි ලංකාවේ හෝටල් වල දමා තිබූ වෙන් කිරීම් 75%ක් අවලංගු කර ඇති බවත්, එබැවින් බුද්ධිමත් යැයි පවසන පිරිස මෙම රටට මෙලෙස වැදගත් දෙයක් සිදු කරන්නේදැයිද විමසා සිටින ලදී. ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාවේ තම අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය පිළිබඳව සඳහන් වන බවත් නමුත් එය එසේ තිබුණේයැයි පවසා එය මෙලෙස භාවිතා කිරීමට හැකිදැයිද සෑම දෙයකම සීමාවක් තිබෙන බවත්,දින ගණනාවක් බලා සිටි බවත්, බුද්ධිමත්යැයි පවසන ජනතාව මෙලෙස කුමක් කරන්නේදැයිද විමසා සිටින ලදී.ඉන් පිටුපස තිබෙන බහු ජාතික සමාගම් සහ විදේශ බලවේග මොනවාදැයි දන්නේදැයිද විමසා සිටින ලදී.රාජ්‍ය නොවන සංවිධාන මෙයට සහය වන බවත් යම් තරුණ කණ්ඩායමක් එතැන එකතු වී සිටින බවත් මෙහෙය වන කණ්ඩායමගේ අදහස වෙනම අදහසක් බවත්,ගම්වල තරුණ පිරිස සැණකෙලියක් බැලීමට යන ලෙස එකතු වී බැලීමට යන බවත් විකාරයක් වී ඇති බවත් ප්‍රකාශ කරන ලදී.මෙහි තිබෙන යටි අරමුණ පිළිබඳව තරුණ පිරිස නොදන්නා බවත් මෙය රටේ තිබෙන ගැටළු වලට විසඳුමදැයිද විමසා සිටින ලදී.මෙය විසඳුම නොවන බැවින් ඒ සඳහා උඩගෙඩි ලබානොදෙන ලෙසට දේශපාලන පක්ෂ වලින් ඉල්ලා සිටින බවද ප්‍රකාශ කරන ලදී.ජනාධිපතිවරයෙකු පත් කරන ක්‍රමවේදය ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාවේ තිබෙන බවත්,ඒවා නොදැන ජනාධිපතිවරයාට යන ලෙසට පැවසුවද ඉන් පසුව රට අරාජික වන බවත් එම තත්ත්වය නොදන්නා බවත් ප්‍රකාශ කරන ලදී.මෙලෙස පහර දීමේදී IMF මඟින් ණය ලබා දේවිදැයිද විමසා සිටින ලදී. පළමුව ඔවුන් දේශපාලන ස්ථාවරත්වය පිළිබඳව බලන බවත්,අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ගියා යැයි සිතමුයැයිද ඉන් පසුව ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාව අනුව නැවත ජනාධිපතිතුමෙකු පත් වේවියැයිද එතුමාවද එපා වූ විට නැවත ගෝල්ෆේස් ගොස් ජනතාව නොමඟ යවා ගෝ හෝම් යැයි පවසාවියැයිද, මෙය හොඳ පූර්වාදර්ශයක් නොවන බවත් ප්‍රකාශ කරන ලදී.

තමන් රූපවාහිනිය නරඹන විට සමගි ජනබලවේගයේ නායක සජිත් ප්‍රේමදාස මහතා එතැනට ගිය බවත් එතුමාට එලව එලව පහර දුන් බවත්, තම කණ්ඩායමේ පිරිසක්ද එතැනට ගිය බැවින් ඔවුන්වද පොලීසිය කඳුළු ගෑස් ගසා එලවූ බවත්, පවසනා පරිදි විශාල විනාශයක් සාපේක්ෂව ගොඨාගෝගමට සිදු වී නොමැති බවත්,පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ඇතුළු 8 දෙනෙකු ජීවිත පූජා කල බවත්, ගොඨාගෝගමට ගිය විට සර් යැයි පවසා ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර කුමාර දිසානායක මහතාව පිළිගත් බවත් ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදි.එසේ නම් එය මෙහෙය වන්නේ ජනතා විමුක්ති පෙරමුණ බව අවිවාදයෙන් පිළිගත යුතු බවත් ප්‍රකාශ කරන ලදී. මෙලෙස විනාශ සිදු කිරීමේදී ඩොලර් පැමිණේවිදැයිද විමසා සිටින ලදී.මහ බැංකු අධිපති රට ස්ථාවර කරන ලෙසට පවසන බවත් මෙම මුළු රටම අරාජික කරනුයේ ජනතා විමුක්ති පෙරමුණෙන් මෙහෙය වන ගොඨාගෝගම බවත් ප්‍රකාශ කරන ලදී.මෙය රට පුරා පැතිරී වෙන්නප්පුවේද එහි ශාඛාවක් තිබෙන බවත් ඉන්පසුව තව තව කණ්ඩායම්ද බිහි වන බවත් තම නිවසට පහර දීමට පැමිණි ප්‍රධානීන් දෙදෙනා වන කාන්තාව සහ පිරිමියා වෙන්නප්පුව ගෝඨාගෝගමින් බිහි වූ නිලධාරීන් දෙදෙනෙකු බවත් ඔවුන්ගේ නීතිඥවරයා අධිකරණයේදීම පිළිගත් බවත් ප්‍රකාශ කරන ලදී.තමන්ද එවිට එය දැනගත් බවත් ප්‍රකාශ කරන ලදී.තමන් මීන් පෙර දැක නොමැති බවත් එම කාන්තාව යකඩ පොල්ලක් ගෙන දැඩි ආවේගශීලිව තම නිවසට පහර දුන් බවත්,තමන් 1997 වර්ෂයේ සිට අඛණ්ඩව දේශපාලනය සිදු කරන බවත් පහලොස් වතාවක් පමණ ඡන්දය දිනා ඇති බවත් ප්‍රකාශ කරන ලදී.පහර දීම් කිසි දිනක සිදු කර නොමැති බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී. මෙම සිදු වීම් වැරදි පූර්වාදර්ශයක් බවත්,හැඳුනුම්පත් පරීක්ෂා කලේ කවුරුන්දැයි දුටුවේදැයිද කණේ කරාබු දමා කොණ්ඩ පාටකර පච්ච ගසා ගෙන කඩු පොලු අතැතිව සිටි පිරිසක් දුටු බවත්, ඔවුන් රටේ තරුණ බලවේගයයැයිද, මුහුණු පොත හරහා රට සෑදීමට යන්නේ ඔවුන්දැයිද විමසා සිටින ලදී.දෙරණ නාලිකාවේ මාධ්‍ය සාකච්ඡාවකදී ජනතාව කැඳවූවේදැයිද විමසා සිටි බවත්, එවිට තම මුහුණු පොතේ පිරිසව තමන් දැනුවත් කල බව පැවසූ බවත්, එමෙන්ම එම නාලිකාවේ වසන්ත සමරසිංහ නම් පුද්ගලයා 10 වනදා උදැසන වීථී බසින ලෙසට ජනතාවට පැවසූ බවත්, හට 04ක් 05ක් ගිණි තිබ්බෙයැයි,කීප දෙනෙකුට පහර දුන්නේයැයි පවසා රටේ ජනතාවටම පාරට බසින ලෙසට පවසන බවත්, නීතිය අනුව පොලීසියට ගොස් පැමිණිල්ලක් දැමූවේ නම් පරීක්ෂණ සිදු කරන බවත් ,එය බලා ඔවුන්ව අත්අඩංගුවට ගන්නා බවත් ප්‍රකාශ කරන ලදී.මාධ්‍ය ඔස්සේ පාරට බැස උද්ඝෝෂණය කරන ලෙසට පවසන බවත්, මෙලෙස පවසනුයේ ජනතා විමුක්ති පෙරමුණේ කැඳවුම්කරුවෙකු වන වසන්ත සමරසිංහ මහතා බවත්, එමෙන්ම ලාල්කාන්ත මහතා ාතම ජාලයට වහාම පැමිණෙන ලෙසට දැනුම් දුන් බව පිළිගත් බවත් මේ සියල්ල සඳහා ඉදිරියේදී නීතිය ක්‍රියාත්මක වේයැයිද ප්‍රකාශ කරන ලදී.අතිගරු ජනාධිපතිතුමා සාධාරණ බවත්,ගෝඨාගෝගමට කවුරුන් හෝ පහර දුන්නේ නම් ඒ අයගේ පැමිණිලි මත නීතිය ක්‍රියාත්මක වේයැයිද මේ වන විට අත්අඩංගුවට ගෙන රිමාන්ඩ් කර ඇති බවත් ප්‍රකාශ කරන ලදී.ගම් වල මෙලෙස ද්වේශය වැපිරීමට ඉඩ ලබා නොදෙන ලෙසත් එසේ වුවහොත් කිසිවෙකුට දේශපාලනය කිරීමට ඉඩ නොලැබෙන බවත් දේශයක් නොමැති වී යන බවත් ප්‍රකාශ කරන ලදී. අප නිරායුධව සිටි මන්ත්‍රීවරුන්ගේ නිවෙස් වලට පැමිණ එලෙස විනාශ කිරීම් සිදු කල බවත් ප්‍රකාශ කරන ලදි.2018 පෙබරවාරි මස 10 වන දින ප්‍රදේශීය සභාවට පත් වූ බවත්, හොරායැයි මතයක් ගොඩ නඟා 2015 ජනවාරි මස 08 වන දින ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාව පරාජයට පත් කල බවත්,2015 ජනවාරි මස 08 වන දින සිට 2019 නොවැම්බර් මස 26 අතිගරු ජනාධිපති ගෝඨාභය රාජක්ෂ මැතිතුමා පත් වී පැමිණෙන තෙක් පැවති රජයේ රනිල් වික්‍රමසිංහ මැතිතුමා, අනුර කුමාර දිසානායක මැතිතුමා,සජිත් ප්‍රේමදාස මැතිතුමා යන කණ්ඩායමද සිටි බවත් ඔවුන්ට හොරු ඇල්ලීමට වසර 05ක කාලයක් තිබූ බවත්, නමුත් දැන් නැවත එලෙස පවසන බවත් ඔවුන්ට සොරු අල්ලා ඒවා අයකර ගැනීමට කාලය තිබූ බවත් ප්‍රකාශ කරන ලදි. මැයි 18 වන දින ජනතාවට මතක නැති බවත්, කෙලෙහිගුණ නොදත් ජාතියක් සිටින බවත් අද ප්‍රභාකරන් සිටියේ නම් කුමක් සිදුවේදැයිද, මහින්ද රාජපක්ෂ මැතිතුමාට ගෙදර යන ලෙසට පැවසුවද 2009 මැයි 18 වන දින එතුමා නොසිටීමට ප්‍රභාකරන් මැරීමට හැකිවේවිදැයිද විමසා සිටින ලදී.

එදින අරලියගහ මන්දිරය වට කල විට එතුමාව හසුවූයේ නම් මරණයකින් අවසන් වන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

සිංහල ජනතාව මෙතරම් කෙලෙහි ගුණ නොදත් ජනතාවක්දැයිද, ඉතාමත් කණගාටු බවත් ඩයස්පෝරාවද මේවා යටින් සිටින බවත් ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ

කරන ලදී. වාහන පර්මිට් එකක් ලබා දී හෝ පිටරටින් ඩොලර් ගෙන්වා ගත යුතු බවත්,අප රුපියල් 10ක් ඩොලරයකට වැඩි කල විට උණ්ඩියල් පිරිස රු.20ක් වැඩි කරන බවත් උණ්ඩියල් සමඟ ඩයස්පෝරාව සම්බන්ධ බවත් එය එසේ තිබෙනතාක් මෙම ගැටළුවලට විසඳුමක් නොමැති බවත් ප්‍රකාශ කරන ලදී.අරගල කල ද කිසිඳු ආකාරයකින් ඩොලර් නොපැමිණෙන බවත් තමන් යෝජනා කරනුයේ වාහන පර්මිට් එකක් ඩොලර් එවන ප්‍රමාණය අනුව ලබා දීම බවත් ප්‍රකාශ කරන ලදී.මුස්ලිම් සහ දෙමළ පිරිස උණ්ඩියල් ක්‍රමය සිදු කරන බවත් පිටරටින් මේ වන විට ඩොලර් නොඑවන බවද ප්‍රකාශ කරන ලදී.මෙලෙස සිංහල ජනතාව විනාශයන් සිදු කලහොත් සහ මෙවැනි විනාශ වලට තරුණයින් යොමු කලහොත් එහි විශාල වගකීමක් දේශපාලන නායකයින්ටද තිබෙන බවත් ප්‍රකාශ කරන ලදී.ජනතා විමුක්ති පෙරමුණ පෙරටුගාමී පක්ෂ සිටින බවත්, ගෝඨාගෝගම වටේට විශ්වවිද්‍යාල තුනක් තිබෙන බවත්,තමන්ද විශ්වවිද්‍යාල ශිෂ්‍යයෙකු වී සිටි බවත්, ඔවුන් රාත්‍රියට ලැගුම්ගන්නේ ද ආහාර ගන්නේද එහි බවත් එය දකිනා ජනතාව මෙය ලංකාවේම හඬ ලෙස දකිනා බවත්, මේවා නොමෙහෙය වන ලෙසට අවසන් ඉල්ලීම බවත් මෙහෙය වන පිරිස පැහැදිලි බවත් ප්‍රකාශ කරන ලදී. තම නිවෙස මෙලෙස බේරුණ බවත්,තම නිවසේ අලාභය දොලොස් ලක්ෂ හතලිස් පන්දහසක් බවත්, වසර විසි පහක ජනතාසේවයට ලැබුණ තිළිණය මෙයදැයි තමාට රාත්‍රියට සිතෙන බවත්, තම පවුලේ පිරිසද ඒ පිළිබඳව විමසන බවත් තමන් ඇතුළු ගරු සභාපතිතුමාගේ,ගරු මන්ත්‍රී ඒල්.දිනේෂ් චන්දන පෙරේරා මහතාගේ,ගරු මන්ත්‍රී ඩබ්.ඒ.රෙන්ෆ්‍රිඩ් ෂවීන් ප්‍රනාන්දු මහතාගේ, ගරු මන්ත්‍රී යූ.ජූඩ් ඒම්මානුවෙල් මහතාගේ, ගරු මන්ත්‍රී ඒ.ඒස්.ඒම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යන සියළු දෙනාගේ නිවෙස් විනාශ කර දැමූ බවත් ප්‍රකාශ කරන ලදී.අප ආසනය ගත් කල ගරු රාජ්‍ය අමාත්‍ය අරුන්දික ප්‍රනාන්දු මැතිතුමාගේ නිවස එමෙන්ම සනත් නිශාන්ත ඇමතිතුමාගේ නිවසද විනාශ කර දැමූ බවත් ප්‍රකාශ කරන ලදී. මොවුන් කරන සේවය ජනතාව නොදකින බවත්, ගරු රාජ්‍ය අමාත්‍ය අරුන්දික ප්‍රනාන්දු මැතිතුමා අද එක් ප්‍රදේශයක හෙට එක් ප්‍රදේශයක සිටින බවත් මෙසේ දුවා දුවා සිදු කරන සේවාව නොදකින බවත්, දේශපාලඥයින් දෙස ජනතාව ද්වේශයෙන් බලන බවත්, අද රාජ්‍ය නිලධාරීන් සැප සම්පත් භුක්ති විඳින බවත්, අද වන විට සූර්ය බලාගාර අප සාකච්ඡා කල පරිදි සවි කර තිබූයේ නම් කෙතරම් වටීයැයිද ප්‍රකාශ කරන ලදී.වසර දෙකහමාරක් ගත වුවද ඉංජිනේරුවරුන් එය සිදු නොකල බවත් ඒවායෙහි ප්‍රතිපල භුක්ති විඳින බවත් ප්‍රකාශ කරන ලදී.එක් සුලං රවුමකින් මෙගාවොට් එකක් ලැබෙන බවත්,ඒවා 300 ක් අප බල ප්‍රදේශයේ ඉදි කලේ නම් නොරොච්චෝලේ බලාගාරයේ එක් කලාපයක විදුලිය අපට ලැබෙන බවත්, 900ක් ඉදි කලේ නම් මුළු බලාගාරයේ ප්‍රමාණයම ලැබෙන බවත්, මේවා නිලධාරීන්ද දන්නා බවත් නිලධාරීන්ද රට නාස්ති කල බවත් ප්‍රකාශ කරන ලදී. පැමිණෙන ඇමතිවරුන්ව නිලධාරීන් යටත් කර ගන්නා බවත් ඉන්පසුව ඇමතිතුමා නිලධාරියාට යටත් බවත් මෙතෙක් එලෙස කටයුතු සිදු වූ බවත් ප්‍රකාශ කරන ලදී. 2019 වර්ෂයේ අප්‍රියෙල් 21 වන දින කතෝලික ජනතාවට බෝම්බ ප්‍රහාරය දැමූ බවත් නමුත් ප්‍රාදේශීය සභා මැතිවරණය 2018 පෙබරවාරි මස 10 වන දින තිබී 90%ක බලය ලැබී ජයග්‍රහණය කර තිබූ බවත් ඒබැවින් කතෝලික ජනතාව මරා නැවත රාජ්‍ය බලයක් ගැනීම අවශ්‍ය නොවූ බවත් ප්‍රකාශ කරන ලදී.කතෝලික ජනතාවවද යම් යම් අය විසින් නොමඟ යවන බවත්, එම පාස්කු ප්‍රහාරයට අත්අඩංගුවට ගෙන ඇති පිරිස 775ක් බවත්,නඩු 79ක්ද දමා ඇති බවත් ප්‍රධාන පිරිස තම ජීවිත හානි කරගෙන මැරී ඇති බවත් තවත් තිදෙනෙකු පමණක් අත්අඩංගුවට ගතයුතු බවත් එම නම් තමන් නොපවසන බවත් ප්‍රකාශ කරන ලදී.

එහි මහ මොලකරු කවුරුන්දැයි ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ගෝඨාභය වික්‍රමසිංහ මහතා විමසා සිටින ලදී.

මහ මොලකරු ජීවිත හානිකරගෙන මැරී ඇති බව ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.ජාතික හැඳුනුම්පත් අංකය සමඟ සහරාන්ගේ නම පැමිණි බවත්, ඔහුව අත්අඩංගුවට නොගත්තේ මන්දැයිද විමසා සිටින ලදී. 2019 සිට ඩොලර් ලංකාවට නොපැමිණි බවත්, පිටරට ගෙන ගියේ සිලින් නම් එරට මුදල් බවත් ජනතාව දරණ බොරු මත බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

පොලිස්පතිතුමාව නිදහස් වූයේ අපරාද චෝදනා වලින් පමණක් නිදහස් වූ බවත් සිවිල් නඩු 200ක් තවත් තිබෙන බවත්,මේවා ජනතාව නොදන්නා බවත් ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.වෙන්නප්පුව ආසනය තුළ මෙවැනි ම්ලේච්ඡ සංස්කෘතියක් ඇතිවීම පිළිබඳව කණගාටු වන බවත්, ජනතාව කුපිත කර මෙවැනි විනාශයක් අද අපට හෙට ඔබට අතිවිය හැකි බවත්,දේශපාලනය කිරීමට අපට දේශයක් අවශ්‍ය බැවින් එය ඉතිරි කර ගනිමුයැයිද ඒ සඳහා අප

සියළු දෙනා අපකැප වෙමුයැයිද පවසමින්, ජනතාව කුපිත නොකරන ලෙසද පවසමින්, ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා තම කතාව අවසන් කරන ලදී.

(V). ගරු මන්ත්‍රී ඩබ්.ශිරෝන් ගාමිණී අසෝක ප්‍රනාන්දු මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියලු දෙනාගෙන් අවසර ගැනීමෙන් පසුව පසුගිය 09 වන දින සිදු වූ සිදු වීම පිළිබඳව ගරු මන්ත්‍රීවරුන් කීපදෙනෙකුම අද දින කතා කල බවත්,එදින මැදිහත් වී යම් සහයෝගයක් ලබා දීමට නොහැකිව අසරණ වූ බවත්, එදින තෝප්පුවේ තිබූ වාතාවරණය කිසිවෙකු ඇස් දෙකින් නොදැකපු බවත් ප්‍රකාශ කරන ලදී. එතැන සිටියේ කිසිවෙකුගේ කීමට අවනත නොවන පිරිසක් බවත්, විශාල පොලු අතේ තබාගෙන හෙල්මට් දමාගෙන සිටි බවත්, මන්ත්‍රීවරයෙකු ලෙස තමන්ද එතැන හැල්ලුවට ලක් වූ බවත් ප්‍රකාශ කරන ලදී. එහි තමන් සමඟ ගරු මන්ත්‍රිනී ඩබ්.දුලක්ෂි වමෝදරී ප්‍රනාන්දු මහත්මියගේ පියාද සිටි බවත්, එතැන තවදුරටත් සිටීම සුදුසු නොවන බව තීරණය කර එතැනින් විසිරී ගිය බවත් ප්‍රකාශ කරන ලදී. ඉන් පසුව තම නිවසට පහර දීමක් සිදු වන බව පවසා තම ඥාති සොහොයුරාද කතා කල බවත්, එම අවස්ථාවේ එතැනට යාමද විශාල අභියෝගයක් බවත්, තමන් තවත් අයෙකු සමඟ එම ස්ථානයට යන විට ටයර දෙකක් ගිනි තබා තිබූ බවත්, ඉන්පසුව සමීපයට ගිය විට බිම් මහළ විනාශ කර තිබූ බවත් ප්‍රකාශ කරන ලදී. පුද්ගලිකව ඒ පිළිබඳව හිතට අමාරු බවත් එමෙන්ම හිටපු සභාපති ගරු ට්‍රෙවින් ප්‍රනාන්දු මහතාගේ නිවසටද විශාල වශයෙන් හානි කොට තිබූ බවත්,එමෙන්ම ගරු සභාපතිතුමාගේ, ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතාගේ, ගරු මන්ත්‍රී එල්.දිනේෂ් චන්දන පෙරේරා මහතාගේ නිවෙසටද හානි කොට තිබූ බවත් ප්‍රකාශ කරන ලදී. වාද විවාද කෙතරම් කලද එතැනින් එහාට කෙදිනකවත් නොගිය බවත්,නමුත් මෙම සිදු වූ සිදු වීමට පක්ෂයක් ලෙසද සියළුම දෙනාට කණගාටුව ප්‍රකාශ කරන බවත් පවසා සිටින ලදී. විශේෂයෙන්ම සමගි ජන බලවේගයේ බොහෝ ක්‍රියාකාරීන් එතැනට නොපැමිණියේ විපක්ෂනායක ගරු සජිත් ප්‍රේමදාස මහතාට පහර දුන් නිසා වන්නට ඇතැයිද, එය එසේ නොවීමට පිරිස වැඩි වන බවත් නමුත් නන්නාදුනන 3000ක පමණ පිරිසක් සිටි බවත් ප්‍රකාශ කරන ලදී. එම ස්ථානයේ ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටන් කුමාර් මහතා එතැන තනි වී සිටි බවත්, එතුමා සමඟ පිරිසක් එතැන නොසිටි බවත් ප්‍රකාශ කරන ලදී. බුද්ධි අංශ නිලධාරීන්ද සිටි බවත්, සහකාර පොලිස් අධිකාරීතුමාද සිටි බවත් කිසිවෙකුට කිසිවක් කර ගැනීමට නොහැකි බවූ බවත් එතැන සිටි පිරිසද කිසිවෙකුට වලංගු පිරිසක් නොවන බවත් ප්‍රකාශ කරන ලදී. පුද්ගලික පළිගැනීම් ක්‍රියාත්මක වූ බව පෙනී යන බවත්,ඒ පිළිබඳව කණගාටුව ප්‍රකාශ කරන ලදී.

යම් කාලයක සිට රට ඉතාමත් අමාරු කාලයක් පසු කරන බවත්, ඒ පිළිබඳව කමිටු වලදීද පුද්ගලිකවද කතා කල බවත් ගෑස් සොයා ගැනීමට නොමැති බවත්, තෙල් පෝලිම් වල මන්ත්‍රීවරුන්ද පැය ගණනක් සිටින බවත් එයටද ගරු සභාපතිතුමා මැදිහත් වී ක්‍රමවේදයක් සකස් කර නොදුන් බවත් ගරු මන්ත්‍රී ඩබ්.ශිරෝන් ගාමිණී අසෝක ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී. මේවා සමඟ ජනතාව කුපිත වී සිටි බවත්, එමෙන්ම උගණ්ඩාවට මුදල් ගෙන ගිය බවත් සමාජ මාධ්‍ය ජාලා වල සඳහන් වූ බවත්,රටේ ඩොලර් නොමැති වී ගිය බවත් මේ සියල්ල සමඟ ජනතාව ඉතාමත් කුපිත වී සිටින බවත් ප්‍රකාශ කරන ලදී. අති විශාල බහුතර ඡන්දයක් ලබා දුන් බවත්, ජනාධිපතිතුමා හිටපු ආරක්ෂක ලේකම් ලෙස සිදු කල වැඩ කොටස දෙස බැලීමේදී එතුමා වැඩක් කරතැයි සිතූ බවත් ප්‍රකාශ කරන ලදී.එතුමාට වැඩක් කිරීමට අවස්ථාව ලැබුනේයැයි නොසිතන බවත්,හිටපු අගමැති ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා ඇතුළු කණ්ඩායම පැමිණි පසුව ඩොලර් මිලියන හැටදහසක් වසරකට බදු සහන ලබාදුන් බවත්,රාජ්‍ය ආදායම් නැති කරගෙන ජනතාව කුපිත වූවායැයි පවසා වැඩක් නොමැති බවත්,ජනතාවගේ අවශ්‍යතා ඉටු කිරීමට මෙම ආණ්ඩුවට නොහැකි වූ බවත්, දරුපවුල් පිටින් එදින තෝප්පුවට පැමිණ සිටි බවත් ප්‍රකාශ කරන ලදී. දිනක් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී එස්.බී.දිසානායක මහතා එතුමාගේ අමුතු ශෛලියෙන් ඩොලර් ප්‍රශ්නය හරියැයි පැවසූ බවත් ඒලෙස ඩොලර් සෙවීමට හැකියාවක් තිබූයේ නම් කිසිවෙකු මෙවැනි ගැටළුවකට මැදි නොවන බවත් ප්‍රකාශ කරන ලදී.එම බැරි වීමත් සමඟ ජනතාව ගෝඨාගෝගම ලෙස ඉදි කර ජනාධිපතිතුමාට සියළුම කුණු වැටුණු බවත්, නමුත් එතැන සිට ප්‍රධානියා සහ මෙම රට සම්පූර්ණයෙන්ම කඩා වැටීමට වගකිවයුත්තේ හිටපු ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා බවත් ප්‍රකාශ කරන ලදී. අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට තනිව තීන්දුවක් ගැනීමටවත් ඉඩක් ලැබුණේදැයි තමන් නොදන්නා බවත්, එතුමාගේ වියත්මග පිරිසව හිටපු ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කණ්ඩායම තල්ලුකර දැමීමට පටන් ගත් බවත් ඒවා සියල්ල දුටු බවත් ඒවාට සතුටු නොවූ බවත් ප්‍රකාශ කරන ලදී. අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ඉතාමත් සතුටින්, උත්සාහයෙන් සහ හිත හොඳින් මෙය භාර ගැනීමට ඇතැයිද, හිටපු ගරු

අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා සහයෝගය දෙතැයි සිතීමට ඇති බවත් නමුත් එය සිදු නොවූ බවත් ප්‍රකාශ කරන ලදී.විවිධ ගැටළු මතු වූ බවත් සීනි ප්‍රශ්නය,ටයිල් ප්‍රශ්නය පැමිණීමේදී මුහුණුපොත හරහා එය භාවිතා කරන පිරිස මෙම වෛරය ආරම්භ කල බවත්, නමුත් එය මන්ත්‍රීවරුන්ගේ පිටින් යැවීම කිසිසේත් සාධාරණ නොවන බවත් ප්‍රා දේශීය සභාවේ පාලකයින් මෙයට වගකිව යුතු නොවන බවත්, මෙය ආණ්ඩුවේ ඉහළ ස්ථරයෙන්ම ගිය ගැටළුවක් බවත් ප්‍රකාශ කරන ලදී. රජයේ ආදායම නොමැති වී බෙහෙත් නොමැති වී යාමේදී බය නොවන්නේ කවුරුන්දැයිද විමසා සිටින ලදී. ගරු රාජ්‍ය අමාත්‍ය අරුන්දික ප්‍රනාන්දු මැතිතුමා විශාල සේවාවක් කල පුද්ගලයෙකු බවත්, මෙම සිදුවීම ඉතාමත් කණගාටුදායක බවත්, එම සිදු වූ සිදු වීම කිසිසේත්ම අනුමත නොකරන බවත් ප්‍රකාශ කරන ලදී. සමගි ජනබලවේගයේ මන්ත්‍රීවරුන් ලෙස ප්‍රියාල් බ්‍රයන්ත පෙරේරා මන්ත්‍රීතුමා නිවසින් එළියටවත් නොපැමිණි බවත්, තමාටද නිවසේ සිටින ලෙසට පැවසූ බවත් එම නිසා තම නම හෝ පෙනී සිටීමක්වත් මෙම සිදුවීම් වලට සම්බන්ධ නොවූ බවත් ප්‍රකාශ කරන ලදී.සහෝදරයෙකුට හෝ ගොස් සහය වීමට නොහැකි වීම පිළිබඳව කණගාටු වන බවත්,නමුත් එතුමාගේ ගෝලයන් තිදෙනෙකු දිවි පරදුවට තබා ගොස් ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතාව බේරාගෙන තිබූ බවත්, ගිනි තැබීමක් වුවත් එම අවස්ථාවේදී සිදු වීමට තිබූ බවත් ප්‍රකාශ කරන ලදී.නමුත් හිටපු ගරු සභාපති ට්‍රෙවින් ප්‍රනාන්දු මහතාව බේරා ගැනීමට එතුමාගේ ගමේ පිරිසක් එකතු නොවීමත් කණගාටුදායක බවත් ප්‍රකාශ කරන ලදී. තම කණ්ඩායම් ගිය බවටද ගරු සභාපතිතුමා රැස්වීම ආරම්භ වීමට පෙර තමන් සමඟ පැවසූ බවත්, නයිනමඩම වයික්කාල ප්‍රදේශයේ ගරු සභාපතිතුමන්ලාගේ පක්ෂයට අයත් විශාල පිරිසක් මේවාට නායකත්වය ලබා දුන් බවත් ප්‍රකාශ කරන ලදී. ඒවා ඇස් දෙකට තමන් දුටු බවත් ඒවායෙහි තොරතුරු පැමිණි බවත් ප්‍රකාශ කරන ලදී. විශේෂයෙන්ම නයිනමඩමේ පොහොට්ටුවේ කණ්ඩායමක්ම මූලිකත්වය ගෙන තිබූ බවත් ඔවුන්ගේ නම් පවුල් පසුබිම බැලීමේදී ඔවුන්ගේ දේශපාලන පක්ෂය පැහැදිලි බවත් ප්‍රකාශ කරන ලදී.

එමෙන්ම ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමාගේ මුහුණු පොතේ පෝස්ට් ඒක පිළිබඳව කතා කල බවත් නමුත් එය ජනතාව ඇවිස්සීමක් ලෙස තමන් පිළි නොගන්නා බවත්, සිද්ධින් එකින් එක ගැලපීමේදී එවැනි තත්ත්වයක් නොපෙනෙන බවත්, තෝප්පුවේ එතුමාට බලයක් නොතිබුණ බවත් ගරු මන්ත්‍රී ඩබ්.ශිරෝන් ගාමිණී අසෝක ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

එම පණිවිඩයෙන් පසුව ජනතාව සභාපතිතුමා ගිය බවට දැනගෙන සොයා බැලූ බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

තම නායකතුමාට පහර දුන් බැවින් ඒවාට සම්බන්ධ නොවී සිටිමුයැයි ප්‍රියාල් බ්‍රයන්ත පෙරේරා මන්ත්‍රීතුමා පැවසූ බවත්,ඉන් පසුව රූපවාහිනිය බලමින් සිටියදී හදිසි ප්‍රවෘත්තියක් ලෙස අගමැතිතුමා ඉල්ලා අස් වූ බවට පළ වූ බවත් එවිට රතිඤ්ඤා වැල් දෙකක් ගෙන ගොස් බෝලවත්ත හන්දියේ පත්තු කර සිංහ කොඩියක් ගෙන තොප්පුවට ගිය විට ආපු මෝඩකමයැයි තමාට හැඟුන බවත්, පසුව ටික වේලාවක් සිට නිවසට පැමිණි බවත් ගරු මන්ත්‍රී ඩබ්.ශිරෝන් ගාමිණී අසෝක ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී. හිටපු අගමැති ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා මෙම ගැටළුවට මුල් වූ බවත්, හිටපු ආරක්ෂක ලේකම්තුමා සහ වත්මන් අතිගරු ජනාධිපතිතුමා,නව අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා සමඟ එකතු වී රට වැටී තිබෙන අඩියෙන් ඉහළට ඇදීම කෙසේ වෙතත් එතැනින් පහළට වැටීම නවතා දුනහොත් හොඳ බවත්, ඇත්ත ඇති සැටියෙන් බලා කටයුතු කලහොත් සියළු දෙනාටම මෙන්ම දරුවන්ටද අනාගතයක් ඉතිරිවේයැයි ද පවසමින් තම කතාව අවසන් කරන ලදී.

(VI). ගරු මන්ත්‍රිනී එච්.එම් සුදර්ශී භාග්‍යා කරුණාරත්න මෙනෙවිය ,ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව තමන් දේශපාලනය කතා කිරීමට නොයන බවත්, අද දින සාකච්ඡා කල කතාබහ අනුව තමන්ද කතා කිරීමට සූදානම් වූ බවත් ප්‍රකාශ කරන කරන ලදී.ජනතාවගේ මුදලින් නඩත්තු වන ආයතනයක් ලෙස ජනතාවගේ ප්‍රශ්න කතා කිරීමට මහා සභාව මාසයකට එක් වරක් රැස් වන බවත් දේශපාලන පක්ෂ නියෝජනය කර මෙතැනට තේරී පත් වී පැමිණියද නමුත් දේශපාලනය සඳහා මෙතරම් කාලයක් වෙන් නොකරන ලෙසද ඉල්ලා සිටින ලදී. වෙන්නප්පුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සංවර්ධනයට අවශ්‍ය කාරණා වලට වැඩි කාලයක් යොමු කර , දේශපාලනයට අවශ්‍ය නම් කුඩා කාලයක් වෙන් කරන ලෙසද ඉල්ලා සිටින ලදී. රටේ අර්බුද රැසක් තිබෙන බවත් , BBC ප්‍රවෘත්ති වලද අගමැතිතුමා යම් විට රට වැසීමට සිදුවේයැයිද , පෙට්‍රල් නොමැති නිසා නැවැත්වීමට සිදු වේ යැයි

විශාල සංකල්ප ඉදිරිපත් කරන බවත් , උපරිමයෙන් කාලය ඉතිරි කර විදුලි බලය නවත්වා හැකි ඉක්මනින් සාකච්ඡා කර විසිර යමු යැයිද ප්‍රකාශ කරන ලදී.

සහෝදර මන්ත්‍රීතුමන්ලාට /තුමියන්ලාට සිදු වූ යම් දෙයක් තිබේනම් ඒ පිළිබඳව තම කනගාටුව ප්‍රකාශ කරන බවත් , පෞද්ගලික ව තමන් එ් පිළිබඳව හොයා නොබැලුව බවත් , දැනගැනීමට ද නොලැබුණ බවත් ප්‍රකාශ කරන ලදී. අප රටට බ්‍රිතාන්‍යයන්ගෙන් ලැබුණ අපරාධ නඩු පටිපාටියක්ෙසහ දණ්ඩ නීති සංග්‍රහයක් තිබෙන බවත්, ඕනෑම වරදකට ක්‍රියාමාර්ග ගැනීමට තිබෙන බවත් , නිතිය ඉතාමත් පැහැදිලි බවත් ප්‍රකාශ කරන ලදී.නමුත් පසුගිය කාල සීමාව තුළ කුමන රජයක් පත් වුවද නිති වෘත්තිකයන් ලෙස වසර 20 කට අධික කාලයක් අධිකරණ වල සේවය කරන බවත්, නිතිය හා සාමය යන අමාත්‍යාංශය ක්‍රියාකල ආකාරය පිළිබඳව සෑහීමකට පත්විය නොහැකි බවත් ප්‍රකාශ කරන ලදී. මෙම සිද්ධි මාලාවද හොඳම උදාහරණය බවත් , මෙම සිද්දි මෙලෙස නොවීමට, ගාලු මුවදොර ආදරයේ අරගලයට පහර නොදීමට කටයුතු කිරීමට එම අමාත්‍යාංශය ශක්තිමත් වූයේ නම් රට ගිනි නොගන්නා බව ප්‍රකාශ කරන ලදී. කුමන රජයක් පැමිණියද එම අංශය දුර්වල බවත් , මෙවැනි බරපතල ජාතික ප්‍රශ්නයකදී පොලිසිය, හමුදාව හැසිරනුයේ මෙලෙස නම් ද, අධිකරණ වලද අසල්වැසියන් දෙදෙනෙකු පහර දි ගත් විට ඔවුන්ටද නීතියේ රැකවරණය ලැබී නොමැති බව අත්දැකිමෙන් ද දන්නා බවත් , කුමන රජය පත්වුවද රටේ විමට තිබෙන වැඩ කොටස සිදු වි නොමැති බවත්, ප්‍රකාශ කරන ලදී. ආර්ථිකය, නීති පද්ධතිය, අනෙකුත් ජනතාවගේ සංවර්ධනය අවශ්‍ය අධ්‍යාපනය, සෞඛ්‍ය යන කිසිවක් සෑදී නොමැති බවත් ප්‍රකාශ කරන ලදී. අප දෙපිරිස ද, පාර්ලිමේන්තුවද දේශපාලනය කතා කර ආහාර අනුභව කර නිවෙස්වලට යන්නේ නම් එමඟින් තේරුමක් නොමැති බවත් ප්‍රකාශ කරන ලදී.

දේශපාලනය කතා කිරීමට අවශ්‍ය නම් පෞද්ගලිකව වියදම් කර සංග්‍රහය සූදානම් කර කතා කරමුයැයි ද, රජයේ මුදල් වියදම් කර ඒවා කතා නොකරන ලෙසද ඉල්ලා සිටින ලදී.

මෙහිදී එකිනෙකාට චෝදනා කරගත් බවත්, ගරු සභාපතිතුමාද යම් අයට චෝදනා එල්ල කළ බවත්, යම්කිසි අයෙකු යම්කිසි අපරාදමය වරදක් සිදුකර ඇත්නම් එයට අවශ්‍ය ආයතන වලට පැමිණිලි කරන ලෙසද, නීතිඥයින් ලෙස අවශ්‍ය සහය ලබා දෙන බවත් ප්‍රකාශ කරන ලදී. සභාවේ සාමාජිකයින් කවුරුන් හෝ වරදක් කර ඇත්නම් ජනතාව පොළඹවා ඇත්නම් රටේ නීතියට ගරු කර නීතිය ක්‍රියාත්මක කරන ලෙසත් ඉල්ලා සිටින ලදී. එක්තරා මන්ත්‍රීවරයෙකුට චෝදනා කළ බවත්, එය මහාසභා වාර්තාවෙන් ඉවත් වන්නේ නම් හුඟාක් හොඳ බවත් ප්‍රකාශ කරන ලදී. සියලුදෙනාම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව දිවුරුම් දී ඇති මන්ත්‍රීවරුන් බවත්, එය ආරක්ෂා කිරීමට දිවුරුම් දෙන බවත් එහි මූලික නීතිය නම් අප රටේ ඕනෑම පුරවැසියෙකු නිසි අධිකරණයක නිසි නඩු විභාගයකින් වැරදි කරුවකු කරන තුරු ඔහුට නිර්දෝශීභාවය, ආරක්ෂාව ලැබෙන බවට පූර්ව නිගමනයක් ගන්නා බවත්, එබැවින් කිසිවෙකුට දොස් නොපවසන ලෙසට ද ප්‍රකාශ කරන ලදී.

තමන් එතුමාව හොඳ නොකරන බවත් තමාට අදාළත්වයක් නොමැති බවත් සභාවේ පනත අර්ථනිරූපණය කරන්නේ නම් සියලු දෙනාම සභාවක් මිස පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුන් නොමැති බවත්, සභාවේ සාමාජිකයින් ලෙස අර්ථනිරූපණය වන බවත්, එබැවින් එතුමාගේ Facebook වගන්තිය අපරාද නීතිය අනුව අපරාද වරදකට වැරදිකරුවකු කිරීමට හේතුවේදැයි තමන් නොදන්නා බවත්, එය අධිකරණයේ තීරණය කරතැයිද ප්‍රකාශ කරන ලදී. කිසිවෙකුට චෝදනා, දෝෂාරෝපණය නොකරන ලෙසත් ඉල්ලා සිටින ලදී.

ජනාධිපතිතුමා පසුගිය වෙසක් දින පණිවිඩයේදී ලිච්ඡවී සංකල්පය අනුව රට පාලනය කිරීමට කටයුතු කලයුතු බව ප්‍රකාශ කර ඇති බැවින් ඒ අනුව සමඟිව එක්රැස් වී සමඟිව විසිර යන ලෙසට එහි පළමු කොන්දේසිය තිබෙන බවත් පවසමින් සමගිව අප එක්රැස් වී මෙහි ඇතුළත ඕනෑ තරම් රණ්ඩු වී සමගිව විසිර යමුයැයිද, කිසිවෙකුට චෝදනා නොකරන ලෙසට ද ඔහු අප සාමාජිකයෙකු බවද පවසමින්, හිත්රිදවීමක් ඇතිවූයේ නම් සමාවද අයදමින්, අගතියට පත්වූ සියළු දෙනාටම කණගාටුව ප්‍රකාශ කරමින් තම කතාව අවසන් කරන ලදී.

(VII). ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා, ගරු සභාපතිතුමා ඇතුළු දෙනාගෙන්ම අවසර ගැනීමෙන් පසුව, ගරු මන්ත්‍රී එච්.එම් සුදර්ශී භාග්‍යා කරුණාරත්න මෙනෙවියගේ ප්‍රකාශය සම්බන්ධයෙන් ඉතාමත් ආඩම්බර වන බවත්, එතුමිය අප කොතනද සිටින්නේ යන්න පෙන්නුම් කළ

බවත් ප්‍රකාශ කරන ලදී.සභා වාර්තාවේ 06 වන පිටුවේ තීරණ අංක 04 හි අප ස්ථාවර තැන්පතු දැමූ මුදලේ පොලී ප්‍රතිශතය පිළිබඳව නොදැනුවත් බවත්, එමෙන්ම 09 පිටුවේ තීරණ අංක 05 අනුව වෙරළ තීරයේ බීගන් බල්බ පිළිබඳව සාකච්ඡා කළ බවත් එහි තොරතුරු මෙම මහ සභාවට ඉදිරිපත් කරන බවට තීරණයේ සඳහන් කර ඇති බවත් ප්‍රකාශ කරන ලදී.මේවා අද දින සිදු නොවූ බවත්, මෙහි කතා කළේ මොනවාදැයිද විමසා සිටින ලදී.

එහි සම්පූර්ණ විස්තරය ලබා ගෙන ඇති බවත්, හිටපු සභාපති හෙක්ටර් අප්පුහාමි මහතා එයට අත්සන් කොට ලබාගෙන ඇති බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

එය ඊළඟ මහ සභාවට යොමු කරන ලෙසට ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.එමෙන්ම 10 වන පිටුවේ සූර්ය බල ශක්ති පද්ධතිය පිළිබඳව සඳහන් බවත්, එහි ප්‍රගතිය මහ සභාවට යොමු කරන බවට පවසා ඇති බවත් ප්‍රකාශ කරන ලදී.එහි ප්‍රගතිය විමසා සිටින ලදී.

අදාල වැඩකටයුතු සිදුවෙමින් පවතින බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.විදුලිය බල මණ්ඩලයේ වාර්තාව පැමිණෙන තෙක් සිටින බවත්,මහ සභාවේදී ගන්නා තීන්දු තීරණවල ප්‍රගතිය ඊළඟ මහ සභාවට යොමු කිරීමට වැඩ පිළිවෙළක් සකස් කරන බවද තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

ඒවා සඳහා පිළිතුරු ලබා දීම ලේකම් මහතාගේ වගකීම බවත්, ප්‍රමාද වන්නේනම් ඒවාටද හේතු කාරණා දැක්විය යුතු බවත්,පසුගිය මස සංශෝධනය කළ වීථි පහන් නඩත්තු වාර්තාවේද සංශෝධිත වාර්තාව නොලැබුණ බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

ඒ පිළිබඳව කතා කිරීමට සූදානම් වූ බවත් එම වාර්තාව සභාවට ඉදිරිපත් කළ යුතු බවත් ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.එය එදිනම නිවැරදි කළ බවත්, වාර්තාව ලැබීමට සලස්වන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

අප ඉටු කළ යුතු වගකීම් හා යුතුකම් ඉෂ්ට කර පසුව අනෙක් පුද්ගලයින් පිළිබඳව කතා කරමු යැයිද, ගරු මන්ත්‍රීතුමියගේ කතාව නිවැරදි බවත්, ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.

මෙම සිද්ධිය පිළිබඳ කතා කිරීමේ දී ඉතාමත් අවාසානාවන්ත සිදුවීමක් බවත්,තමන් හිටපු ගරු සභාපති ට්‍රෙවින් ප්‍රනාන්දු මහතා සහ හිටපු ගරු සභාපති ධර්මසිරි ඇරැව්ගොඩ මහතා 1991සිට එක දිගට වසර 24 ක් මෙම සභාවේ සිටි බවත්, ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාද සිටි බවත්,එලෙස සිටි මහජන නියෝජිතයෙකුට මෙවැනි සිද්ධියක් වනවිට පක්ෂ භේදයකින් තොරව අනුමත නොකරන බවත් ප්‍රකාශ කරන ලදී.

එය කවුරු සිදු කළත් වැරැද්දක් බවත් , එයට එක්සත් ජාතික පක්ෂයේ සහ එකට සේවය කළ මන්ත්‍රීවරුන් ලෙස කණගාටුව ප්‍රකාශ කරන බවත්, එය වචනයෙන් පැවසිය නොහැකි බවත් ප්‍රකාශ කරන ලදී.එතුමාට වතුර බීමටවත් වීදුරුවක්වත් නොමැති බව නයිනමඩම පුද්ගලයෙකු පැවසූ බවත්, මහජන සේවය සිදු කර එලෙස වැටීමට අවශ්‍ය නොවන බවත්, මෙහිදී හරි වැරැද්ද කතා කොට තේරුමක් නොමැති බවත් ප්‍රකාශ කරන ලදී.ඕනෑම දෙයකට ආරම්භයක් තිබිය යුතු බවත් ආරම්භයක් නොමැතිව අවසානයක් නොමැති බවත් මෙහි ආරම්භය කුමක්දැයි තර්ක කිරීමට නොයන බවත් නමුත් ආරම්භය අරලියගහ මන්දිරයේ සිද්ධිය බවත් ප්‍රකාශ කරන ලදී.ගරු සභාපතිතුමා සමඟ ගිය කිරිමැටියාන ප්‍රදේශයේ සමහරු පැමිණ තිබෙනුයේ දින දෙක තුනකට පසුව බවත් එහි නම් නොකියන බවත්,ඔවුන් ගෙන ගොස් ඇත්තේ කුමන දේවල්ද යන්නද තමන් මෙහිදී නොපවසන බවත් ප්‍රකාශ කරන ලදී.තම හෘද සාක්ෂිය ප්‍රබලම ආයුධය බවත්, තම හෘද සාක්ෂියට තට්ටු කර බලන ලෙසත්, මෙහිදී විවේචනයක් නොව මතක් කිරීමක් කරන බවත් ප්‍රකාශ කරන ලදී.ඕනෑම ක්‍රියාවකට ප්‍රතික්‍රියාවක් ඇති බවද තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

එය වැරැදි තොරතුරක් බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.කිරිමැටියාන ගමෙන් ගිය පිරිසක් පිළිබඳව පවසන්නේදැයි ද ගරු උප සභාපති ආර්.ඒ.නිලංක සඳකැල් මහතී විමසා සිටින ලදී.

සභාවේ සේවකයින් බව ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.ඔවුන් දින දෙක තුනකට පසුව නිවසට පැමිණ ඇති බවත් ප්‍රකාශ කරන ලදී.

එලෙස කවුරුත් නොගිය බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ඒවා සොයා බලන ලෙසත් හෘද සාක්ෂියට තමන් කතා කරන බවත් ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී. මේ තුළ පාඩමක් ඉගෙන ගනිමුදැයිද වැඩිහිටියෙක් ලෙස පවසන බවත් දේශපාලනයේදී හුඟක් පිරිස පාඩම් ඉගෙන නොගත් බවත් ප්‍රකාශ කරන ලදී. ගරු මන්ත්‍රී එච්.එම් සුදර්ශී භාග්‍යා කරුණාරත්න මෙනෙවිය නවක මන්ත්‍රීවරියක් ලෙස කියූ කතාව සර්ව සම්පූර්ණ බවත්, අපට පාඩමක් ඉගැන්වූ බවත් ප්‍රකාශ කරන ලදී.මෙම සිද්ධි මෙලෙස වීමට ඉඩ නොදී එකමුතු වෙමුදැයිද තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

ඕනෑම පුද්ගලයෙකුගේ වැරදි අඩුපාඩු තිබෙන බවත්, හිතේ විවේචනයක්, පළිගැනීමක් තිබේනම් ඒවා අවම කර ගන්නා ලෙසත්, අප කෙසේ පැවසුවත් පාලනය කළ සියලු දෙනාම, අපද වගකිව යුතු බවත්, වැඩිහිටියන් ලෙස අවශ්‍ය විට ආදර්ශය පෙන්වා නොමැති බවත්, නිහඩ වීමද වරදක් බව පවසමින්, බලය දෙවියන් විසින් තීරණය කරන බවත්, එය මනුෂ්‍ය මට්ටමින් තීන්දු කිරීමට ගොස් මෙම වැරදි සිදු වූවායැයිද පවසමින් විල්බැරෝව තල්ලු කරගෙන ගිය තාත්තා මෙන් ගරු සභාපතිතුමාව විශ්වාස බවත්, එකට අත්වැල් බැඳගෙන ඉදිරියට යමුයැයිද, හෘදසාක්ෂිය අනුව සියලුදෙනාටම ජීවත් වීමට වාසනා මහිමය ලැබේවායිද ප්‍රාර්ථනා කරමින් තම කතාව අවසන් කරන ලදී.

(VIII).ගරු මන්ත්‍රී අයි.බී.සෑම් හරිෂ්නාත් සරත්චන්ද්‍ර මහතා, ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව, මේ කාලවකවානුවේ ඉදිරියේදී දුප්පත්, අහිංසක ජනතාවට ජීවත් වීමට අපහසු කාලයක් උදාවෙන බවත්, එක් පවුලක එක් අයෙකු රැකියාව කරන විට දරු පවුලක පස් හය දෙනෙකු සඳහා රු.1000 ක්, රු.1500 ක් දිනකට ලැබෙන බවත්, එය ප්‍රමාණවත් නොවන බැවින්, පක්ෂ පාට භේද අතහැර ඔවුන්ට අප සභාව මඟින් මාසයකට දීමනාවක් හෝ සලාක ක්‍රමයට ආහාර මල්ලක් හෝ ලබා දීමට හැකියාව තිබේනම් ලබාදෙමු යැයිද ප්‍රකාශ කරන ලදී.

එය සභාව මට්ටමින් ලබා දිය නොහැකි බවත්, පෞද්ගලික මට්ටමින් ලබා දිය හැකි බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. තමාට කළ හැකි උපකාරයක්, පෞද්ගලික මට්ටමින් සිදු කරන බවත් එවැනි අවස්ථා වල තමාව දැනුවත් කරන ලෙසද දැනුම්දෙන ලදී.

ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව, මේ පිළිබඳව කතා කිරීමට ගියහොත් කනගාටුවෙන් මෙම සභාවේදී මෙය පැවසීමට සිදු වන බවත්, පසුගිය කාලයේ තමන්ද සේවකයින් සමග එකතු වී වැඩ කළ බවත්, එම සේවකයින් වෙසක් දින දෙකේදී බාර් වසා ඇති බැවින් රු.650 ට බියර් බෝතලය ගෙනවිත් පානය කළ බවත්, එක් අයෙකු බෝතල් 06 ක් පමණ පානය කළ බවත් දරු පවුල බඩගින්නේ සිටින බවත් ප්‍රකාශ කරන ලදී. මිනිසුන්ට ආධාර දීමට යාමේදී එම සතියේ වැඩට නොපැමිණෙන බවත්, සමෘද්ධි සතියේ වැඩට නොපැමිණෙන බවත් එය යථාර්තය බවත් ප්‍රකාශ කරන ලදී.

න්‍යාය පත්‍රය අනුව සියළු වැඩ කටයුතු අවසන් වූ හෙයින් සියලු දෙනාටම ස්තූතිය පළ කරමින් ගරු සභාපතිතුමා විසින් ප.ව 2.00 ට පමණ සභාවේ වැඩ කටයුතු අවසන් කරන ලදී.